(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 3.]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

**2019 ජූලි 23 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2019 ජූලි 12 වැනි සිකුරාදා**

---

## 2019 ජූලි 23 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

46/'18

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා දැනට ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

151/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නියෝජිතයන්ගේ නම් හා අදාළ පළාත් පාලන ආයතන කවරේද;

(iii) එම වැඩමුළු පැවති රටවල්, නගර හා කාලසීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම එක් එක් වැඩමුළුවලට සහභාගී වීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් දියත් කළ පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

269/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

368/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු කොළපතන වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක භාර අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

451/'19

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 70 සම්පූර්ණ කරන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත ගෙවීමට වෙන් කරන ලද මාසික දීමනාව රු. 2000/-ක් බවත්;

(ii) 2016 ජනවාරි මාසයේ සිට එම මුදලින් රු. 100/-ක් නොගෙවා රඳවා ගන්නා බවත්;

(iii) මෙලෙස රඳවා ගන්නා මුදල සමාජ ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට රැස්කරන බව නිලධාරීන් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙලෙස වැඩිහිටි දීමනාවෙන් මුදල් අයකිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දක්වන විරෝධය මත එම මුදල අය කිරීම අත්හිටුවීමට ක්‍රියා කරන්නේද;

(ii) මේ වනතෙක් අයකරගෙන ඇති මුදලේ එකතුව කොපමණද;

(iii) එම මුදලින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ යහපත පිණිස මේ දක්වා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

469/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යහපාලන රජය ආරම්භ වූ දින සිට 2018 අගෝස්තු මස දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදුකළ බඳවා ගැනීම්වලට අදාළව,

(i) බඳවාගත් මුළු සේවක සංඛ්‍යාව;

(ii) තනතුරු නාම;

(iii) ක්‍රමවේදය;

(iv) පුරප්පාඩු පැවති දිස්ත්‍රික්ක;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම රැකියාලාභීන්ගෙන් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය වන,

(i) සේවක සංඛ්‍යාව,

(ii) තනතුරු,

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) යම් රාජ්‍ය ආයතනයක පුරප්පාඩුවක් ඇති වුවහොත්, එම ආයතනය පිහිටා ඇති ප්‍රදේශයේ සිටින සුදුස්සන් සඳහා එම රැකියා අවස්ථාව ලබාදිය යුතු බවත්, එමගින් අදාළ කාර්යයන් වඩා කාර්යක්ෂමව සිදුකළ හැකි බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

472/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රසායනික පොහොර භාවිතයෙන් ගොවීන් බැහැර කිරීම සඳහා ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර නිෂ්පාදනය කළ යුතු බව පිළිගන්නේද;

(ii) වර්ෂ 2014 සිට 2017 දක්වා නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පොහොරවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙළක් සකසා තිබේ නම්, එය කවරේද;

(iv) මෙම පොහොර ප්‍රමිතියෙන් යුක්ත බව සහතික කරන ආයතන තිබේද;

(v) එසේ නම්, එම ආයතනවල නම් කවරේද;

(vi) ප්‍රමිති පරීක්ෂාව සඳහා වගකිවයුතු ආයතනයක් නොමැති නම්, එවැනි ආයතනයක් ඇති කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

497/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.12.31 දිනට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ නියමිත මිනිස් බල ඇස්තමේන්තුව හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සේවය කළ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) 2015 ජනවාරි සිට මේ දක්වා ආයතනයට බඳවා ගෙන ඇති ස්ථිර, අනියම් හා තාවකාලික සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව බඳවා ගත් පුද්ගලයන්ද ඒ අතර සිටින බව පිළිගන්නේද;

(v) මෙම බඳවා ගැනීම් හා ඔවුන්ට වැටුප් ගෙවීම් පිළිබඳව ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

9.

575/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිකවැරටිය, මාගල්ලේ වැව යටතේ වගා කරන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම වැවේ, වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් පදිංචිවී සිටින බව දන්නේද;

(iii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙසේ අනවසර පදිංචිකරුවන් රැඳී සිටීම නිසා වැවට දරුණු හානි සිදුවන බව දන්නේද;

(v) එසේ නම්, එම අනවසර පදිංචිකරුවන් ඉවත් කර මෙම වැව සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

658/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 80 දශකයේදී ත්‍රිකුණාමලය වරායට පවරාගෙන ඇති ඉඩම්වල,

(i) විවිධ වර්ගයේ ඔප්පු තිබූ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) බලපත්‍ර හා දීමනා පත්‍රලාභීන් සංඛ්‍යාව;

(iii) පදිංචි නිවාස සංඛ්‍යාව සහ ඒවායේ තත්ත්වය;

(iv) ව්‍යාපාරික ස්ථාන සහ එම එක් එක් ව්‍යාපාරිකයාගේ නම, ලිපිනය සහ ව්‍යාපාරයේ ස්වභාවය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

686/'18

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගා කර ඇති ඉඩම් ප්‍රමාණය සහ එම වගාවන්හි යෙදෙන ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග ඵලදාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුළු අපනයන භෝග වගාකරුවන් සඳහා රජය මඟින් ලබාදෙන සහනාධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව පහත වැටී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

698/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.09.30 දිනට සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රාජ්‍ය සමාගම්වල අධ්‍යක්ෂ ධූරයක් හෝ කළමනාකරණ මණ්ඩල සාමාජික ධූරයක් දරන ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන් කවුරුන්ද;

(ii) 2017.09.30 දිනට සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රාජ්‍ය සමාගම්වල අධ්‍යක්ෂ ධූරයක් හෝ කළමනාකරණ මණ්ඩල සාමාජික ධූරයක් දරන ද්විත්ව පුරවැසියන් වන පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

772/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ ක්‍රියාකාරී අයුරින් ව්‍යාපාරික කටයුතු සිදුකරනු ලබන පෞද්ගලික මූල්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන සතු සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රාග්ධන සම්පාදනය කරගත් ආකාරයන් කවරේද;

(iv) එම ආයතන තම මූල්‍ය ක්‍රියාකාරකම් සිදුකරගෙන යාමේදී එම කටයුතු අධීක්ෂණය කිරීමට අධිකාරි බලය ඇති ආයතනය කවරේද;

(v) එම අධීක්ෂණය ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016/2017 වර්ෂවලදී පෞද්ගලික මූල්‍ය ආයතනයක් වන ඊ. ටී. අයි (ETI)මූල්‍ය සමාගමේ කොටස්කරුවන් වෙත වන්දි ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් වෙන්කිරීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) පෞද්ගලික මූල්‍ය ආයතනවල ආයෝජනය කළ ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටු කළ හැකි විකල්ප ක්‍රම කවරේද;

(iv) පෞද්ගලික මූල්‍ය ආයතනයන්හි ආයෝජනය කළ ගනුදෙනුකරුවන්ට මහජන මුදලින් වන්දි ගෙවීම වැරදි පූර්වාදර්ශයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

836/'19

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයේදී මල්වතු ඔය පිටාර ගැලීමෙන් ඇතිවූ ගංවතුර ව්‍යසනයෙන් මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ජනතාව පීඩාවට පත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගංවතුර ව්‍යසනයෙන් පීඩාවට පත්වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සඳහා සහන සැලසීමට රජය වෙන් කළ මුදල කොපමණද;

(iii) එම මුදලින් එක් පවුලකට ලබාදෙන ලද සහන මුදල කොපමණද;

(iv) සහන මුදල් ලබාදෙන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බෙදා හරින ලද්දේ කවර ආයතන හෝ පුද්ගලයන් මඟින්ද;

(ii) එම ආයතන හෝ පුද්ගලයන්ගේ නම් සහ රාජකාරි ලිපිනයන් කවරේද;

(iii) එම ආයතන හෝ පුද්ගලයන්ට නිකුත් කරන ලද චෙක්පත් පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

854/'19

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 ජනවාරි සිට රු.10,000/-ක විශේෂ දීමනාව රාජ්‍ය සේවක වැටුපට එකතු කර මූලික වැටුප රු.10,000/-කින් ඉහළ නැංවීම නිසාත්;

(ii) 2016 වසරට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයන්ගේ වැටුපට එකී මුදල එකතු නොවීම නිසාත්;

විශ්‍රාමික රාජ්‍ය සේවක වැටුප් විෂමතාවක් නිර්මාණය වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අයවැය යෝජනා මඟින් නැවත වරක් රාජ්‍ය සේවක වැටුප් ඉහළ යාමෙන් එකී විෂමතාවය ඉහළ යන බැවින් එම විෂමතාවය ඉවත් කිරීමටත්;

(ii) විශ්‍රාමික රාජ්‍ය සේවකයා නිරන්තර වැටුප් විෂමතා ඉවත් කරගැනීමේ සටන්වල නිරත වීම වැළැක්වීමටත්;

(iii) රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම්වලදී ඉන් සාධාරණ ප්‍රතිශතයක් විශ්‍රාමික රාජ්‍ය සේවක වැටුපට එකතු කිරීමේ නිත්‍ය ක්‍රියා පිළිවෙතක් පැවතීමේ වැදගත්කමත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම වැටුප් විෂමතාවය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) වැටුප් විෂමතාවය නිවැරදි කරනු ලබන ප්‍රතිශතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ යෝජනාව,— 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ 3 වගන්තිය යටතේ:—

(අ) මෙහි උපලේඛනයේ විස්තර කරඇති "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා තුළට ඇතුළත් කිරීම මඟින්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා වෙනස් කරනු ලැබිය යුතු බවට; සහ

(ආ) ඒ ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එක් කරනු ලැබිය යුතු බවටත්

මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

**උපලේඛනය**

මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණය කර ඇති, බස්නාහිර පළාතේ කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි අංක 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර 446.6153කින් සමන්විත "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන, පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය:—

| **සම්බන්ධ වන ලක්ෂ්‍යය - කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම** | **නැගෙනහිර ඛණ්ඩාංක** | **උතුරු ඛණ්ඩාංක** |
|---|---|---|
| උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 396913.476 | 492847.764 |
| දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 397077.037 | 492290.222 |

*(සමුද්දේශ ඛණ්ඩාංක පද්ධතිය: Srilanka Grid 1999)*

**1.** කැබලි අංක **2 :** ප්‍රමාණය හෙක්ටයාර **155.8376**

උතුරට - කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර
නැගෙනහිරට - කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 7
දකුණට - ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3
බටහිරට - කැබලි අංක 6, 3 සහ 6

**2.** කැබලි අංක **3 :** ප්‍රමාණය හෙක්ටයාර **15.0933**

උතුරට - කැබලි අංක 2
නැගෙනහිරට - කැබලි අංක 2 සහ 6
දකුණට - කැබලි අංක 6 සහ 4
බටහිරට - කැබලි අංක 4 සහ 6

**3.** කැබලි අංක **4 :** ප්‍රමාණය හෙක්ටයාර **113.5311**

උතුරට - කැබලි අංක 6 සහ 3
නැගෙනහිරට - කැබලි අංක 3 සහ 6
දකුණට - කැබලි අංක 6, 5 සහ 6
බටහිරට - කැබලි අංක 6, 5 සහ 6

**4.** කැබලි අංක **5 :** ප්‍රමාණය හෙක්ටයාර **14.7856**

උතුරට - කැබලි අංක 6 සහ 4
නැගෙනහිරට - කැබලි අංක 6 සහ 4
දකුණට - කැබලි අංක 6
බටහිරට - කැබලි අංක 6

**5.** කැබලි අංක **6 :** ප්‍රමාණය හෙක්ටයාර **101.1038**

උතුරට - කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2
නැගෙනහිරට - කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7
දකුණට - කැබලි අංක 2 සහ 7
බටහිරට - කැබලි අංක 2 සහ 7

**6.** කැබලි අංක **7 :** ප්‍රමාණය හෙක්ටයාර **46.2639**

| | | |
|---|---|---|
| උතුරට | - | ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2 |
| නැගෙනහිරට | - | කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය |
| දකුණට | - | ඉන්දියානු සාගරය |
| බටහිරට | - | ඉන්දියානු සාගරය |

*3.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.06.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.06.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*7.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

පඩිපාලක සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි.

*17.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝගය (අංක 1),— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ (මිල නියම කිරීම) සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 15 දිනැති අංක 2114/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*20.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝගය (අංක 2),— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ ඖෂධ (මිල ඉහළ සීමා) සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 15 දිනැති අංක 2123/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*21.

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා,— පොදු කොන්ත්‍රාත් පනත යටතේ නියෝගය,— 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 36 වගන්තිය යටතේ 2012 අගෝස්තු 30 දිනැති අංක 1773/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් අවසන් වරට සංශෝධනය කරන ලද, 1988 ජුනි 02 දිනැති අංක 508/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග තවදුරටත් සංශෝධනය කරමින් ජනාධිපතිවරයාගේ එකඟත්වය පරිදි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 24 දිනැති අංක 2055/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා විමසා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 26 දිනැති අංක 2116/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*24.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*26.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

28.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

මෝහන් ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

ඡායා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## **2019 ජූලි 24 වැනි බදාදා**
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

47/’18

ගරු හේෂා විතානගේ මහතා,— සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා,

(i) ශ්‍රී ලංකාවේ අලුතින් ආරම්භ කරන ලද විදේශ ආයෝජන සහිත කර්මාන්ත සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රට තුළ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මේ වනවිට පවතින පහසුකම් සැපයීම හා නීතිරීති මඟින් ආයෝජකයන් අධෛර්යමත් වන බව පිළිගන්නේද;

(ii) ආයෝජකයන් සඳහා ඉතා කඩිනම් සේවාවක් සැලසීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

94/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය වනවිට ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ඉන්ටර්පෝල් ලැයිස්තුවට ඇතුළත් කරන ලද LTTE හිතවාදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාව වනවිට අදාළ ලැයිස්තුවට ඇතුළත්ව සිටි කොටි ත්‍රස්තවාදීන් සංඛ්‍යාව සහ පාතාල සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයෙන් පසුව මේ වනවිට ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කර ඇති LTTE හිතවාදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 න් පසුව මේ වනවිට ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කර ඇති කොටි ත්‍රස්තවාදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංවිධාන සහ ත්‍රස්තවාදීන් ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) අදාළ ඉවත් කිරීම් සඳහා ශ්‍රී ලංකා රජයේ අනුමතිය ලබා දී තිබේද;

(v) ජාත්‍යන්තර වශයෙන් LTTE හිතවාදීන් ශ්‍රී ලංකා රජයට එරෙහිව ගෙන යන වැඩපිළිවෙළට එම ඉවත් කිරීම්වලින් උත්තේජනයක් ලැබෙන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

152/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව කැළිකසළ කළමනාකරණය යන විෂය පළාත් සභා යටතේ එන විෂයයක් බව දන්නේද;

(ii) එසේ නම්, පළාත් සභා ආරම්භයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභා කවරේද;

(iii) එසේ විශේෂිත ආයතනයක් පිහිටුවා නොමැති පළාත් සභා කවරේද;

(iv) එසේ ආයතනයක් පිහිටුවා නොමැති පළාත් සභාවල සුවිශේෂී ආයතනයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4\.

270/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5\.

369/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලෙවලන්ඩ් වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක භාර අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6\.

498/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, බැස්ටියන් මාවතේ පිහිටි පෞද්ගලික බස් පර්යන්තයේ කටයුතු අධීක්ෂණය කළ හැකි වන පරිදි පසුගිය රජය විසින් සීසීටීවී කැමරා පද්ධතියක් සවි කිරීමට කටයුතු කළ බව දන්නේද;

(ii) එම කැමරා අතරින් මේ වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කැමරා සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යයේදී අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(iv) මෑතකදී කැමරා අක්‍රීයව තිබියදීත්, අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා මුදල් වැය කර ඇති බව දන්නේද;

(v) මේ සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7\.

576/’19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇන්ටේ ලෙකෝ ප්‍රයිවට් ලිමිටඩ් (Ante Leco (pvt) Ltd.) සමාගම පිළිබඳ රජයට ඇති අයිතිය කවරේද;

(ii) එම සමාගම ආරම්භ කරන ලද අරමුණ කවරේද;

(iii) ආරම්භයේ සිට එම සමාගම විසින් නිෂ්පාදනය කර ඇති විදුලි මීටර් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට එම සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8\.

608/’18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්,

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදුකළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන් පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදුකරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

659/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කන්තලේ නගරයේ පිහිටා ඇති, දැනට වාර්ෂික බදු පදනම යටතේ ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යනු ලබන සහ නේවාසිකව පදිංචිව සිටින ස්ථාන වෙනුවෙන් වූ බදු ගිවිසුම් සමහර පුද්ගලයන් විසින් තවමත් දීර්ඝ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කන්තලේ නගරයේ එලෙස බදු පදනම මත සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වාර්ෂික බදු ගිවිසුම් දීර්ඝ කර නොමැති පුද්ගලයන් කවුරුන්ද;

(iii) එලෙස බදු ගිවිසුම් දීර්ඝ නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

688/'18

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කොළඹ, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජාතික පාසල්වල,

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කවරේද;

(ii) ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 6 වැනි ශ්‍රේණියට ඇතුලත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව කොපමණද;

(iv) 6 වැනි ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) 6 ශ්‍රේණියේ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත ඇතුලත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

773/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට 2016 වර්ෂයේ ජනවාරි සිට 2018 අගෝස්තු 31 දින දක්වා ලබා දී ඇති ණය මුදල් වටිනාකම කොපමණද;

(ii) මෙම ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකය කොපමණද;

(iii) ඉහත ණය මුදල ගෙවා අවසන් කිරීම සඳහා ලබා දෙන උපරිම කාලසීමාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබාදීමේ දී අදාළ මූල්‍ය ආයතන තබා ගනු ලබන ඇපකර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) ට අනුව ලබා දී ඇති ණය මුදලින්, 2018 අගෝස්තු 31 දින වනවිට අය වී ඇති මුළු මුදල හා පොළිය කොපමණද;

(ii) මේ වනවිට අයවිය යුතු නමුත්, මෙතෙක් අය වී නොමැති ණය මුදල් අයකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සෑහීමට පත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

861/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ නිවසක් ඉදිකර ගැනීම සඳහා ඉඩමක් නොමැති පවුල් 6579ක් සඳහා නිවසක් ඉදිකිරීමට ඉඩමක් ලබාදීම සඳහා රාජ්‍ය වතු සමාගම් සන්තකයේ ඇති ඉඩම්වලින් අවශ්‍ය බිම් ප්‍රමාණය ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, රජය විසින් ගැනීමට අපේක්ෂිත විකල්ප ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

950/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2012 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් හජ් වන්දනාවේ යෙදෙන බැතිමතුන් ශුද්ධ වූ මක්කම නගරයට රැගෙන යෑම පිණිස නියෝජිත ආයතන තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(ii) ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයන්/ආයතන කවරේද;

(iii) එම එක් එක් ආයතන/පුද්ගලයන් සඳහා සම්මුඛ පරීක්ෂණයට අමතරව ලිඛිත තරඟ විභාග පවත්වනු ලැබූ අවස්ථා තිබේද;

(iv) එම තරඟ විභාග සහ සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත්වූ පුද්ගලයන්/ආයතන සහ එක් එක් වර්ෂයේ ලබාගත් ලකුණු සංඛ්‍යාව කවරේද;

(v) ඒ අතරින් තෝරා ගනු ලැබූ පුද්ගලයන්/ආයතන සංඛ්‍යාව කොපමණද;

(vi) එම පුද්ගලයන්/ආයතනවල නම් ලිපිනයන් හා වෙන් කරනු ලැබූ කෝටා ප්‍රමාණය කොපමණද;

(vii) එම තෝරාගත් පුද්ගලයන් සහ ආයතන අතුරින් "IATA" බලපත්‍රය හිමි ආයතන සංඛ්‍යාව සහ එම ආයතනවල විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

971/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ප්‍රධාන නගරයක් වන කැකිරාව සහ ඒ අවට විශාල ප්‍රදේශයක් ආවරණය කරමින් රාජකාරි කටයුතු සිදුකරනු ලබන කැකිරාව පොලිස් ස්ථානය මේ දක්වා පවත්වාගෙන යනු ලබන්නේ පැරණි ගොඩනැගිලිවල බව දන්නේද;

(ii) වර්තමානයට ගැලපෙන පරිදි මෙම පොලිස් ස්ථානය නවීකරණය කිරීමට පියවර ගන්නේද; එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම කාර්යය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1025/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 281, 282, 283 සහ 284 හි සඳහන් කර ඇති කරුණු අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන් අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(ii) යෝජනා අංක 284ට අනුව, ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොටස් වෙළෙඳපොළ වර්ධනය මැන බැලීම සඳහා යොදා ගන්නා සම්මත දර්ශකයන්ට අනුව, වර්ෂ 2000 සිට 2017 දක්වා, ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ප්‍රගතිය පිළිබඳ උපනතීන් දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) වර්තමානයේදී අසාමාන්‍ය ලෙස පොළී අනුපාතිකය ඉහළ ගොස් පැවතීම, කොටස් වෙළෙඳපොළ සංවර්ධනයට බාධාවක් ලෙස සලකන්නේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් දරනු ලබන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 ජූලි 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

48/'18

ගරු හේෂා විතානගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල, ඇල්ලේතොට ගමේ පදිංචි ජනතාව උග්‍ර පානීය ජල ගැටලුවකට මුහුණදී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

99/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී, 2015 වර්ෂයේ සිට ඝාතනය වූ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම පොලිස් නිලධාරීන් ඝාතනය වීමට හේතු සඳහන් කරන්නේද;

(iii) ඔවුන්ගේ අඹුදරුවන් වෙනුවෙන් ගෙවන ලද දීමනාවල වටිනාකම සඳහන් කරන්නේද;

(iv) එම නිලධාරීන්ගේ අඹුදරුවන් ආරක්ෂා කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර කවරේද;

(v) ඔවුන්ගේ වැන්දඹු අනත්දරු දීමනා නිසි පරිදි ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඝාතනය වූ පසු උසස්වීම් ලබා දී ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඝාතනය වූ පසු උසස් වීම් ලබා දී නොමැති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඝාතනය වූ පසු උසස්වීම් ලබා දී නොමැති නිලධාරීන් සඳහා උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අපරාධ මැඩලීමේ ක්‍රියාවලියේ යෙදී සිටින පොලිස් නිලධාරීන්ගේ ජීවිතාරක්ෂාව සහ ඔවුන්ගේ අඹුදරු රැකවරණය සම්බන්ධයෙන් මේ වනවිට පවතින ක්‍රමවේදය වර්ධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය සිදු කරනු ලබන කාලසීමාව සහ අපේක්ෂිත ක්‍රමවේදය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

153/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළිකසළ සම්බන්ධව තීරණ ගන්නා, ඒ සම්බන්ධව කටයුතු කරන පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරින් කැළිකසළ කළමනාකරණය සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වී තිබේද;

(iii) එසේ නම්, එම නිලධාරින්ගේ නම්, තනතුරු හා විදේශ අධ්‍යයනවල විස්තර කවරේද;

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එකී අධ්‍යයන චාරිකාවලට සහභාගි වූ නිලධාරින්ගේ දැනුම අමාත්‍යාංශයේ කටයුතුවලට යොදාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

370/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2002 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලූල්කඳුර වතුයායේ සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

422/'19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා Hyrax oil Sdn Bhd යන සමාගම අතර ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ගිවිසුමට අනුව එකඟතාවයට පැමිණි මූලික කරුණු පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් නිසි අවසරයක් ගෙන තිබේද;

(v) ඉහත ගිවිසුම අනුව අදාළ සමාගම දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කර තිබේද;

(vi) යෝජිත ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය තෙල් වර්ග ආනයනය කිරීමට බලපත්‍ර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

499/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2018.06.30 දින දක්වා "සිසුසැරිය" බස් සේවාව සඳහා යොදවා තිබූ බස්රථ සංඛ්‍යාව හා ඒවා යොදවා ඇති මාර්ග කවරේද;

(ii) එකී මාර්ගවල ධාවනය කරනු ලබන පෞද්ගලික හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පෞද්ගලික බස්රථ සඳහා ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බස්රථ ධාවනය සඳහා යොදවා ඇතැයි ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර මුදල් ලබාගෙන ඇති පුද්ගලයන් සිටී නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

609/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුස්සැල්ලාව නගරයේ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආගමික ස්ථානවල නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

619/'18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල - දොළොස්බාගේ මාර්ගය මංතීරු දෙකකට පුළුල් කිරීම සඳහා 2012 වර්ෂයේදී වැඩකටයුතු ආරම්භකර මේ වනවිට කුරුඳුවත්තේ සිට වැලිකන්ද දක්වා කිලෝමීටර් 7ක දුරක් කාපට් අතුරා වැඩ අවසන් කර ඇති බවත්;

(ii) 2015 ජනවාරි සිට පුරා වසර තුන හමාරක කාලය තුළ මෙම මාර්ගයේ කිසිදු වැඩ කටයුත්තක් සිදු නොවූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) විශාල වාහන ප්‍රමාණයක් හා විශාල ජනතාවක් භාවිතා කරන මෙම මාර්ගයේ ඉතිරි කිලෝමීටර් 4 සඳහා ප්‍රතිපාදන වෙන්කර වැඩ ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

655/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය – නුවර පාරේ, 6 කණුවේ සිට ත්‍රිකුණාමලය – අනුරාධපුර පාරේ, කින්නියා දක්වා දිවෙන ත්‍රිකුණාමලය පිටත වටරවුම් පාරේ වැඩ ආරම්භ කර වර්ෂ ගණනාවක් ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මංතීරු 6ක් දක්වා වැඩි කළ හැකි වන පරිදි මං තීරු 4කින් යුක්තව මෙම මාර්ගය ඉදිකරන්නේද;

(ii) 2015 ජනවාරි වනවිටත් පාර කපා බොරළු දමා සකස් කර තිබුනද, අද වන තෙක්ම ගල් අතුරා කාපට් දැමීමට නොහැකි වීමට හේතුව කවරේද;

(iii) මේ වනවිට ඉදිකිරීම් භාර කොන්ත්‍රාත් සමාගම කවරේද;

(iv) මෙම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කර භාරදිය යුතු දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

774/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවක පවත්වාගෙන යනු ලබන පේෂකර්ම මධ්‍යස්ථාන බොහොමයක් රැකියා විශාල සංඛ්‍යාවක් බිහි කරමින් ජාතික නිෂ්පාදනයට සෘජු හා වක්‍ර ලෙස දායක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන පේෂකර්ම මධ්‍යස්ථාන සංඛ්‍යාව, අනු ශාඛා සංඛ්‍යාව සහ ගෘහස්ථ මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිවෙළින් කොපමණද;

(ii) ගම්පහ දිස්ත්‍රික්කය තුළ මේ වනවිට වසා දමා ඇති ප්‍රධාන පේෂකර්ම මධ්‍යස්ථාන සංඛ්‍යාව, අනු ශාඛා සංඛ්‍යාව සහ ගෘහස්ථ මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිවෙළින් කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් මධ්‍යස්ථාන වැසී යාමට බලපෑ ප්‍රධාන හේතු සහ සාධක සහ ඒ හේතුවෙන් අහිමි වී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම දේශීය කර්මාන්තයේ උන්නතියට සහ කර්මාන්තය නගා සිටුවීම සඳහා 2019 අයවැය මඟින් කර ඇති යෝජනා කවරේද;

(v) එම යෝජනා පිළිබඳ සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවුලපිටිය ආසනය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින පේෂකර්ම මධ්‍යස්ථානවල වාර්ෂික පිරිවැටුම කොපමණද;

(ii) මෙම මධ්‍යස්ථාන ඉදිරියට පවත්වාගෙන යැම අධීක්ෂණය කිරීමේ බලය ඇති ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

813/'19

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවා ගැනීමට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවා ගැනීමේදී උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවා ගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වූයේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

864/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 වර්ෂයේදී පහත සඳහන්;

(i) කොලොන්න තේ පරීක්ෂක කොට්ඨාසයේ දොරපනේ කුඩා තේ වතු සංවර්ධන සමිතිය සහ දංපනේ කුඩා තේ වතු සංවර්ධන සමිතිය;

(ii) රක්වාන තේ පරීක්ෂක කොට්ඨාසයේ රං ගොව්කන්ද කුඩා තේ සංවර්ධන සමිතිය සහ වෙරළුගහ මුල කුඩා තේ වතු සංවර්ධන සමිතිය;

(iii) නිවිතිගල තේ පරීක්ෂක කොට්ඨාසයේ, දොඹගම්මන කුඩා තේ වතු සංවර්ධන සමිතිය, වන්නිය වත්ත කුඩා තේ වතු සංවර්ධන සමිතිය, යක්දෙහිවත්ත කුඩා තේ වතු සංවර්ධන සමිතිය සහ හොරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය;

(iv) මාදම්පේ තේ පරීක්ෂක කොට්ඨාසයේ, ඇල්පිටිය කුඩා තේ වතු සංවර්ධන සමිතිය සහ බිබිලේගම කුඩා තේ වතු සංවර්ධන සමිතිය;

යන සමිතිවලට පොහොර සහනාධාරය ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්, එම සමිතිවලට 2016 වර්ෂයේ පොහොර සහනාධාරය ලබා දුන් බව සනාථ කරන ලියවිලි ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

964/'19

ගරු බිමල් රත්නායක මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 205, ගජනැග්ගම වසමේ පිහිටි හාමුගෙ වත්ත නමින් හඳුන්වන අක්කර 23ක වපසරියක් සහිත ඉඩම දේශපාලනඥයෙකු විසින් 2017 අගෝස්තු 05, 06 හා 07 යන දිනවලදී මැනුම් කටයුතු සිදු කළ බවත්;

(ii) මැනුම් කටයුතු සිදු කර බෙදා වෙන්කිරීමෙන් පසු, රජයේ සේවකයන්ට ගෙවල් සෑදීම සඳහා බෙදා දීමේ මුවාවෙන් මුදලට විකිණූ බවත්;

(iii) ප්‍රදේශයේ ජනතාව එම ක්‍රියාවලියට විරෝධය දැක්වීමෙන් පසු එම ඉඩම බෙදා වෙන් කිරීම නීති විරෝධී බව අදාළ රජයේ නිලධාරින් විසින් තහවුරු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i)හි සඳහන් ඉඩම, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් ඉඩමක්ද යන්න සඳහන් කරන්නේද;

(ii) එය වෙනත් අමාත්‍යාංශයකට පැවරූ ඉඩමක් නම්, එම අමාත්‍යාංශය කවරේද;

(iii) මෙලෙස රජයට අයත් ඉඩමක් නීති විරෝධීව බෙදා වෙන් කිරීමට ක්‍රියාකරන ලද පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සඳහා පියවර ගන්නේද;

(v) කවර හෝ ව්‍යාපෘතියක් සඳහා මෙම ඉඩම භාවිතයට ගැනීමේ සැලසුමක් තිබේද;

(vi) එසේ නම්, ඒ කුමක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

972/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය වර්ෂයේ ආරම්භ කළ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රණවිරු ගම්මානය තුළ ස්ථාපිත කර ඇති ඉපලෝගම පොලිස් ස්ථානය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) පොලිස් ස්ථානයකට සුදුසු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර එහි පොලිස් ස්ථානය පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1026/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට සිටි මුදල් අමාත්‍යවරයාගේ 'දින 100 විප්ලවය' පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් පරිදි ගර්භනී මාතාවන් සඳහා රුපියල් 20,000/- ක දීමනාවක් ලබාදුන්නේද;

(ii) 2015 සහ 2016 වර්ෂවලදී ඉහත ප්‍රතිලාභය හිමි වූ ගර්භනී මාතාවන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2015 සහ 2016 වර්ෂවලදී ගර්භනී මාතාවන්ට රුපියල් 20,000/- බැගින් ලබාදීම වෙනුවෙන් රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

(iv) ඉහත (i) හි සඳහන් ප්‍රකාශනයේ 7.29 හි දැක්වෙන පරිදි නිකුත් කළ උපදෙස් චක්‍රලේඛයෙහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ජූලි 26 වැනි සිකුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

51/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන "පුරනැගුම" ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

100/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී 2015 වර්ෂයේ සිට ආබාධවලට ලක් වූ පොලිස් නිලධාරින් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම පොලිස් නිලධාරින් අතරින් පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් වෙනුවෙන් ගෙවා ඇති දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) දීමනා ගෙවා නොමැති නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට දීමනා ලබා නොදීමට හේතු කවරේද;

(vi) පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ නිලධාරීන් සඳහා මාසික වේතන නිසි පරිදි ලබා දෙන්නේද;

(vii) මාසික වේතන ලබා නොදෙන පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ නිලධාරින් සිටින්නේද;

(viii) එසේ නම්, ඔවුන්ට මාසික වේතන ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

154/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල - බණ්ඩාරවෙල මාර්ගයේ, 2 වැනි සැතපුම් කණුව අසළ පාලම දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) මෙම පාලම හරහා ප්‍රවේශ විය යුතු ගම්මානවල නම් කවරේද;

(iii) මෙම පාලමේ ඇති පෞරාණික බව ආරක්ෂා වන පරිදි නවීකරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

371/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු මහවිල වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

423/’19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චිවේලි පුරාවිද්‍යා ස්ථානය ගැසට් කර ඇති දිනය කවරේද;

(ii) එම පුරාවිද්‍යා ස්ථානය පිළිබඳව පුරාවිද්‍යාත්මක සමීක්ෂණයක් හෝ ගවේෂණයක් සිදු කර තිබේද;

(iii) මෙතෙක් හමුවී ඇති පුරාවිද්‍යාත්මක කරුණු කවරේද;

(iv) ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම පුරාවිද්‍යා ස්ථානය විනාශයට තුඩුදෙන අයුරින් එයට අයත් ඉඩම්වල කිසියම් බාහිර පාර්ශවයන් පදිංචිව සිටින්නේද;

(vi) ඒ අනුව එම පුරාවිද්‍යා ස්ථානයට සිදුවී ඇති හානිය පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(vii) මේ වනවිට මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය ආරක්ෂා කිරීමට ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

504/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මධ්‍යම නුවර ගම් පළාතේ ඉදිකළ නිවාස යෝජනා ක්‍රමයේ නිවාස බෙදා දෙනු ලැබූ පදනම කවරේද;

(ii) බෙදා දෙනු ලැබූ නිවාස ලබාගත් එක් එක් පුද්ගලයාගේ නම, නිවසේ අංකය, නිවාසලාභියා රජයේ සේවකයෙක්ද, රජයේ විශ්‍රාමිකයෙක්ද යන්න සඳහන් කරන්නේද;

(iii) නිවාස යෝජනා ක්‍රමය ප්‍රදේශයේ වන අලින් ගමන් ගන්නා අලිමංකඩක් අවහිර වන පරිදි ඉදිකර ඇති බව දන්නේද;

(iv) නිවාසලාභීන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා අලි වැටක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සඳහා ඉදි කරන ලද ඵලකය සඳහා ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ, නම් ඒ මන්ද?

7.

577/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මල්ලවපිටිය ලංකා විදුලිබල මණ්ඩල කාර්යාල පරිශ්‍රයේ දැවැන්ත විදුලි උත්පාදන යන්ත්‍ර සමූහයක් ස්ථාපිත කර තිබෙන බවත්;

(ii) මෙම යන්ත්‍ර ක්‍රියාත්මක වීමේදී පිටවන අධික ශබ්දය හේතුවෙන් අවට ජනතාව දැඩි පීඩාවකට ලක්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම යන්ත්‍ර සවිකිරීම සඳහා පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, පාරිසරික ඇගයීම සිදුකළ ආයතනය කවරේද;

(iii) මෙම ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

610/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ දෙක තුළ මහනුවර දිස්ත්‍රික්කයේ,

(i) සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව;

(ii) මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) අත්අඩංගුවට පත් වූ මත්ද්‍රව්‍යවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දැනට හඳුනාගෙන ඇති තහනම් මත්ද්‍රව්‍ය ගණයට අයත් මත්ද්‍රව්‍ය වර්ග හා ඒවා මෙරටට පැමිණෙන රටවල් ඇතුළත් නාමලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ හා අවට ප්‍රදේශ කලක සිට මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ මධ්‍යස්ථානයක්ව පවතින බවත්, පාසල් ශිෂ්‍යයන් හා තරුණ පිරිස් ඉලක්ක කරගනිමින් සිදුකරන මෙම බෙදාහැරීමේ ජාලය තවමත් ශක්තිමත්ව ක්‍රියාත්මක වන බවත් දන්නේද;

(ii) මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කඩිනමින් නීතියේ රැහැනට හසුකර, මත් උවදුර ප්‍රදේශයෙන් තුරන් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

621/’18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් රුපියල් කෝටි 250ක් වැය කරමින් නාවලපිටිය නගර සංවර්ධන වැඩසටහන් සිදු කළ බවත්;

(ii) එම වැඩසටහන යටතේ නාවලපිටිය නගරය තුළ විවිධ ස්ථානවල තිබූ ව්‍යාපාර ගැසට් කර ස්ථානගත කළ බවත්;

(iii) නගරයේ විවිධ ස්ථානවල තිබූ එළවළු වෙළෙඳසැල් පොදු වෙළෙඳපොළ වෙත ස්ථානගත කළ බවත්;

(iv) නගර සභාව විසින් ගැසට් කර අනුමත කර තිබියදී, වත්මන් පාලනය විසින් ව්‍යාපාරිකයන්ගෙන් අල්ලස් ලබාගෙන නගරයේ සෑම ස්ථානයකම එළවළු සහ පලතුරු විකිණීමට අවසර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීතිවිරෝධී ලෙස කරගෙන යනු ලබන මෙම කටයුත්ත නැවැත්වීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

656/’18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කන්තලේ නගරයේ වාරිමාර්ග යාන්ත්‍රික වැඩපොළ අසළ සිට සම්පත් බැංකුව පිහිටා ඇති ස්ථානය දක්වා වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් භූමියේ කඩ කාමර 40ක් පමණ පිහිටා ඇති නමුත්, භූමියේ නිරවුල් අයිතිය ව්‍යාපාරිකයන්ට නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්ථිර ඉදිකිරීම් සහිතව ව්‍යාපාරික ස්ථාන වශයෙන් දැනට භුක්ති විඳින එම ඉඩම් කොටස් වාරිමාර්ග දෙපාර්තමේන්තු අයිතියෙන් මුදා හැරීමට කටයුතු කරන්නේද;

(ii) එකී ව්‍යාපාරිකයන් අද පවතින තත්ත්වයට එම ඉඩම් කොටස් වැඩිදියුණු කර ඇත්තේ යුද ගැටුම් සහිත දුෂ්කර කාලවකවානුවක් තුළ බැවින්, එම ඉඩම්වල වාණිජ වටිනාකම් ඔවුන්ගෙන් අය කිරීමකින් තොරව, භුක්තිය පිළිබඳව සළකා බැලිය නොහැක්කේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

814/’19

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2019 වර්ෂයේ මේ දක්වා,

(i) පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ ගුවන්යානා ඉන්ධන ලීටරයක විකුණුම් මිලෙහි වෙනස් වීම කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ගයේ ඉන්ධන ලීටරයක් මත පනවන ලද සියලුම බදු වර්ග කවරේද;

(iii) මෙම ඉන්ධන වර්ගයන්හි එක් ලීටරයක් සඳහා වැය වූ වියදම කවරේද;

(iv) ලෝක වෙළෙඳපොළේ මිල ගණන් සමඟ සැසඳීමේදී, එක් ලීටරයක් සඳහා ලැබූ ලාභය/පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සෑම මසකම ඩීසල් සහ පෙට්‍රල් විකුණුම් මිල වෙනස් වීමේ පටිපාටිය කවරේද;

(ii) එමඟින් රජය ලබන ලාභය හා පාරිභෝගිකයන්ට ලැබෙන වාසි අවාසි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

865/’19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අලුත්ගම, කලුවාමෝදර, ගම්මැද්ද පාර, අංක 205 හි පදිංචි ටී. බී. දිසානායක මහතා, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුන්දොල ග්‍රාම නිලධාරි වසමේ, දෝතලු ඇල්ල, මූකලානයේ පිහිටා ඇති ගල වසර ගණනාවක සිට කුට්ටිගල් ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන ගිය බවත්;

(ii) මෙසේ වසර ගණනාවක් කුට්ටිගල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියද එය අමාත්‍යවරයෙකුගේ අවශ්‍යතාවයකට අනුව හෝ ජනාධිපතිවරයාගේ සටහනකින් හෝ මෙකී කර්මාන්තය අත්හිටුවා ඇති බවත්;

(iii) ජනාධිපතිවරයා වෙත කරන ලද ඉල්ලීමකට අනුව, නැවත එම කුට්ටිගල් ව්‍යාපාරය ආරම්භ කිරීමට අනුමතිය ලබා දෙන ලෙස හිටපු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ජනාධිපතිවරයා විසින් දන්වා යවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම කුට්ටිගල් ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට අවසර ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

963/’19

ගරු මුහම්මදු නසීර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කරාපිටිය නගර සංවර්ධන වැඩසටහන් යටතේ පසුගියදා රජයට අත්කර ගන්නා ලද ආරච්චිකුඹුර නමැති ඉඩමේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස සලකන ගාල්ල, කරාපිටිය, අනගාරික ධර්මපාල මාවතේ, අංක 87ඒ දරන ස්ථානයේ පදිංචි ඒ. සී. එම්. හසන් මහතාට එම ඉඩමේ වටිනාකම අනුව වන්දි ප්‍රදානය කිරීම මෙතෙක් සිදුවී නොමැති බව දන්නේද;

(ii) සිය ජීවනෝපාය මාර්ගය හා සම්බන්ධිත එම වාණිජ ඉඩම් කොටසට ප්‍රමාණවත් වන්දියක් ඒ මහතාට ලබාදීමට අපොහොසත් වන තත්ත්වයක් තුළ නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කොටසක් ඒ වෙනුවෙන් ඉල්ලා සිටියද මෙතෙක් ඒ සඳහා ප්‍රතිචාරයක් නොදක්වන්නේ මන්ද;

(iii) මේ සම්බන්ධයෙන් සලකා බලා හසන් මහතාට සාධාරණයක් ඉෂ්ඨ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

973/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙනු ලබන විදේශ රැකියාවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නැවත මව් රටට පැමිණීමෙන් පසු ඔවුන්ගේ දරුවන්ට අපහසුවකින් තොරව, පාසල් ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1027/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් අමාත්‍යවරයා විසින්, 'දින 100 විප්ලවය' පිළිබඳ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කළ පරිදි, ගොවි ජනතාව විසින් වාණිජ බැංකුවලට ගෙවීමට ඇති රුපියල් 100,000/- දක්වා වූ ණය ප්‍රාග්ධනයෙන් 50%ක් කපා හරිනු ලැබුවේද;

(ii) ගොවි ණය කපා හැරීම හේතුවෙන් රජයට ඇති වූ වැය බර ප්‍රමාණය කොපමණද;

(iii) ණය කපා හරින ලද ගොවීන්ගේ නාමලේඛනයක් සහ එම එක් එක් ගොවියාගේ නමට ඉදිරියෙන් කපා හරින ලද ණය ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ගොවීන්ගේ කපා හරින ලද ණය වෙනුවෙන් වාණිජ බැංකුවලට රජය විසින් මේ දක්වා ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අගෝස්තු 06 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

4/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කුරගල පුරාවිද්‍යාත්මක ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

132/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ “ලුණුගල බෙසම්වල” නමින් සංචාරක අවධානයක් දිනාගත් ප්‍රදේශයක් තිබෙන බවත්;

(ii) එම ස්ථානය හා එම ස්ථානය අවට දැඩි පරිසර දූෂණයකට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ස්ථානයේ සිදුවන පරිසර දූෂණය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

206/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය සඳහා විසර්ජන පනත මඟින්, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ඉතිරි වූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

319/’18

ගරු සිසිර ජයකොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත සිසුන්ට නව විෂය නිර්දේශයක් හඳුන්වා දී ඇති බවත්;

(ii) වසරක් ගත වී ඇතත්, මේ වනතෙක් ලබා දී ඇත්තේ ඒකක 5ක විෂය නිර්දේශයක් පමණක් බවත්;

(iii) ඒවා ද ලබාදී ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බවත්;

(iv) නව විෂය නිර්දේශය සඳහා ප්‍රායෝගික පරීක්ෂණ හා ගුරු අත්පොත් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විෂය නිර්දේශය හඳුන්වා දෙනවිට ගුරුවරුන්ට ගුරු පුහුණුව හා නව නිර්දේශය පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරනු ලැබුවේද;

(ii) සම්පූර්ණ විෂය නිර්දේශය ලබා දීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

428/'19

ගරු කනක හේරත් මහතා,— තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ලිපි සඳහා තැපැල් ගාස්තු වැඩිකර තිබේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රමාණයකින්ද;

(iii) මෙම තැපැල් ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් පොදු මහජනතාව දැනුවත්කර තිබේද;

(iv) එසේ නම්, එම දැනුම්දීම සිදු කරන ලද ආකාරය සහ මාධ්‍යය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

480/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ කොටස් බදු පදනම මත ලබා දී ඇති රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිල්ලේ බදු දී ඇති වර්ග ප්‍රමාණය, බදු කාලය සහ බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයතන, අදාළ බදු කාලය සඳහා අය විය යුතු මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

510/'19

ගරු විමලවීර දිසානායක මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ක්‍රියාත්මකව පවතින හා විසුරුවා හැර ඇති පළාත් සභාවල මන්ත්‍රීවරයන්ගෙන් කොටසකට සහනදායී බදු පදනම මත වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදී ඇති බවත්;

(ii) එහෙත්, දැනට ක්‍රියාත්මකව පවතින හා විසුරුවා හැර ඇති පළාත් සභාවල ධූර දරන හා නොදරන මන්ත්‍රීවරයන්ගෙන් කොටසකට එම බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීමට පියවර ගෙන නොමැති බවත්;

(iii) මෙතෙක් මන්ත්‍රී ධූර දරන හෝ නොදරන හෝ මන්ත්‍රීවරයන්ගෙන් ඇතමෙකු වසර පහක අඛණ්ඩ ධූර කාලයක් දරා ඇති අතර එයින් වැඩි පිරිසක් මේ වන විට විසුරුවා හැර ඇති පළාත් සභාවල මන්ත්‍රීවරයන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ අනුව, පළාත් සභා මන්ත්‍රීවරයන්ගෙන් කොටසකට සහනදායී බදු පදනම මත බලපත්‍ර ලබාදී තිබියදී, එම සුදුසුකම් සියල්ල සපුරා ඇති වෙනත් මන්ත්‍රීවරයන් පිරිසකට එම බලපත්‍ර ලබා නොදීම බරපතළ අසාධාරණයක් බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වාහන ආනයන බලපත්‍ර මෙතෙක් හිමි නොවූ පළාත් සභා මන්ත්‍රීවරයන්ට එම බලපත්‍ර ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

517/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ මුල් කන්නයේදී බස්නාහිර පළාතේ වගා කරන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) බස්නාහිර පළාතේ වගා නොකර පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) එම වගා නොකර පුරන් වූ කුඹුරුවලින් රටට අහිමි වන වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වගා කරන ලද එහෙත් වගා හානි වූ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම හානි නැවත වරක් ඇති නොවීමට/අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) වගා හානිවීම හේතුවෙන් අසරණ වූ ගොවියන්ට හානිපූර්ණය ලබා දෙනු ලබන දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වගා නොකරන කුඹුරු වෙනත් ආර්ථික කටයුත්තකට යෙදවීමට අවසර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එම අධ්‍යයනයේ අන්තර්ගතය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

544/'19

ගරු බිමල් රත්නායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පේෂකර්ම සංස්ථාවට අයත්ව පැවති තුල්හිරිය පෙහෙකම්හල මුලින්ම බොම්බෙ ටෙක්ස් ආයතනයට විකුණූ බවත්;

(ii) පසුව එම සමාගම විසින් එය කොරියන් සමාගමක් වූ කාබුල් ලංකා ආයතනයට විකුණූ බවත්;

(iii) කාබුල් ලංකා සමාගම විසින් එය වාස් ගෝල්ඩන් ආයතනයට පවරන විට සේවකයන්ට පාරිතෝෂික දීමනා හා වන්දි ගෙවූ බවත්;

(iv) මේ සෑම අවස්ථාවකම ආයතනය විකුණා ඇත්තේ සේවකයන් සහ ඔවුන්ගේ අයිතීන්ද ඇතුළත්ව බවත්;

(v) ඒ වනවිට නිල නිවාසවල පදිංචිව සිටි සේවකයන්ට, කිසිදු මුදලක් නොගෙවූ බවත්;

(vi) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මේ වනවිට මෙම නිවාසවල පදිංචි පුද්ගලයන් ඉවත් කිරීමට උත්සාහ කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සේවයෙන් විශ්‍රාම යනවිට හෝ සේවයෙන් ඉවත් කරන විට මෙම සේවකයන්ට ගෙවා නොමැති පාරිතෝෂික මුදල හා වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) නිල නිවාසවල වසර 40ක පමණ කාලයක් පදිංචිව සිටින පුද්ගලයන් එම නිවාසවලින් ඉවත් කිරීමේ උත්සාහය වළක්වා නිවාසවල හිමිකම ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

598/’18

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැනීම් කටයුතු සඳහා බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දැනට වැලි සම්බන්ධයෙන් මතු වී ඇති ඒකාධිකාරීත්වය මැඩපැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

625/’18

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ අයගේ නම කවරේද;

(ii) ඔහුට හිමි නිලරථ සංඛ්‍යාව, ඉන්ධන දීමනාව, වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඔහුට ගෙවා ඇති සම්පූර්ණ ගෙවීම් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුමත ගෙවීම්වලට අමතරව වෙනත් ගෙවීම් කර තිබේද;

(ii) එසේ නම්, ගෙවා ඇති මුදල කොපමණද;

(iii) එම ගෙවීම් සඳහා අනුමතිය ලබාදුන්නේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

697/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, පහත් බිම් ගොඩකිරීම, නාගරික සංවර්ධන අධිකාරිය විසින් තහනම් කර තිබේ නම්, එම තහනම සිදු කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම තහනම ඉවත් කර තිබේනම්, තහනම ඉවත් කළ වර්ෂය සහ ඊට බලපෑ හේතු කවරේද;

(iii) 2015.01.10 දින සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය හෝ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් කොපමණ සංඛ්‍යාවක් ගොඩකිරීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(iv) එම අනුමතීන් ලබා දී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

763/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහ බැංකු බැඳුම්කර වංචාව හා සම්බන්ධ පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම සෙලාන් බැංකුවේ පවත්වාගෙන යනු ලබන බවට සඳහන් මෙන්ඩිස් සමාගමේ ගිණුම හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ අමාත්‍යවරයන් ප්‍රමුඛ යම් යම් පුද්ගලයන්ට මුදල් ප්‍රදානයන් ලබා දී ඇති බව නිරන්තරයෙන් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම, මෙන්ඩිස් සමාගම නමින් සෙලාන් බැංකුවේ පවත්වාගෙන යන ගිණුමට 2015.01.01 සිට 2018.01.01 දක්වා බැර කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් බැර කර ඇති අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී බැර කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015.01.01 සිට 2018.01.01 දක්වා වූ කාලය තුළ මෙන්ඩිස් සමාගමේ ගිණුමෙන් මුදල් නිදහස් කර ඇති දිනය, එම එක් එක් දිනයේදී නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය සහ එම මුදල් ගෙවා ඇති පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

771/'19

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ උග්‍ර පානීය ජල ගැටලුවක් පවතින බව පිළිගන්නේද;

(ii) ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන පානීය ජල ව්‍යාපෘති කවරේද;

(iii) පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව දන්නේද;

(iv) එසේ නම්, එමඟින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(v) එම ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

883/'19

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගය 2015 වර්ෂයේ පවත්වා ඇති බව පිළිගන්නේද;

(ii) 2015 වර්ෂයේ මාර්තු 14,15,16,17,18,19,20 දිනවල සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති බව දන්නේද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගන්නා ලද පුද්ගලයන් බඳවා ගත් පදනම කවරේද;

(iv) එම පත්වීම් ලාභීන්ගේ නාම ලේඛනය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(v) මෙම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා නොගත් අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් බව පිළිගන්නේද;

(vi) මෙයින් 43 දෙනෙකුට පත්වීම් ලබාදී ඇති බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අභියාචනා ඉදිරිපත් කර තිබූ අංක 1487 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි එස්.කේ.කේ ගුණතිලක මහත්මිය, මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බව දන්නේද;

(ii) ඇය මෙම සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට හේතු කවරේද;

(iii) අතපසුවීමකින් ඇය සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති නම්, ඇය නැවතත් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් සපුරා ඇත්නම්, බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 අගෝස්තු 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

19/'18

ගරු හේෂා විතානගේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භයේ සිට මේ දක්වා,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධන හා සංචිත ප්‍රමාණය;

(ii) කොටස් මත ලද ආදායම සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණය;

(iii) සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් වැය කළ මුළු මුදල් ප්‍රමාණය;

(iv) පුනරාවර්තන නොවන වියදම;

(v) බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය;

(vi) ලාභය හෝ අලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සංසන්දනාත්මකව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

113/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශන වාර්තාව පිළිබඳ එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත්කිරීම සම්බන්ධව අනාවරණය කර ඇති අංක 2 (අ) (i) සිට (x) දක්වා කරුණු;

(ii) එම අනාවරණයන්ට අදාළව අංක 2 (අ) (i) සිට (xiii) දක්වා නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

208/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 යුද්ධමය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ පැවති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) අයත් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව හා ඒවා පිහිටා තිබූ ස්ථානවල ලිපිනයන් කවරේද;

(ii) එම පිරවුම්හල්වල අයිතිකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් අයිතිකරුවන් අතරින් යුද්ධ කාලසීමාව තුළ ඝාතනය වීමෙන්, අතුරුදහන් වීමෙන් හෝ මියයෑමෙන් එම පිරවුම්හල්වල අයිතිය වෙනස් වූ අයිතිකරුවන් කවුරුන්ද;

(iv) ඉන් අනතුරුව, එම පිරවුම්හල්වල අයිතිය ලබාගත් පුද්ගලයන් හා ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(v) පසු අයිතිකරුට මුල් අයිතිකරුගේ ඥාතීත්වයක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් කරුණු සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

416/'19

ගරු ගාමිණී ලොකුගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.01.15 වැනි දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයේ යෙදී සිටි ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බඳවා ගැනීම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පිරිස් පාලන සැලැස්මට අනුකූලව සිදු කර තිබේද;

(iv) ඉහත (ii)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(v) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉහත (v)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

443/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය හෝ එහි කොටසක් ත්‍රිකුණාමලය, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයට හෝ වෙන යම් ස්ථානයකට ගෙන යෑමේ සැලැස්මක් තිබේද;

(ii) නොඑසේ නම්, එහි දැනට පවතින අඩුපාඩු සපුරා දීමට පියවර ගන්නේද;

(iii) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලු ඉඩම් මධ්‍යම රජයට අයත් ඒවා වන බැවින් මෙම කාර්යාලය තවදුරටත් වැඩිදියුණු නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

474/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයතන සංග්‍රහයේ 18:2:1 උප වගන්තියට අනුව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම රජයේ වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි විය යුතු බවත්;

(ii) ආයතන සංග්‍රහයේ 18:3:1 උප වගන්තියට අනුව දරුවා රැකබලා ගැනීම පිණිස දින 84ක අඩ වැටුප් සහිත නිවාඩුවක් හිමිවිය යුතු බවත්;

(iii) ආයතන සංග්‍රහයේ 18:4:1 උප වගන්තියට අනුව අවශ්‍ය වන්නේ නම්, තවත් දින 84ක වැටුප් රහිත නිවාඩුවක් ලබාදිය හැකි බවත්;

(iv) ඉහත (i) යටතේ නිවාඩු ගණන් බැලීමේදී නිවාඩු කාලය තුළ ඇති සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු ඇතුළත් නොකළ යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ වුවද, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද උපාධිධාරී පුහුණු වැඩසටහන යටතේ බඳවාගත් නිලධාරිනියන්ට ලබාදී ඇති පත්වීම් ලිපිය අනුව ඔවුන්ට ලබාදෙනු ලබන්නේ සති 06ක ප්‍රසූත නිවාඩුවක් පමණක් බව පිළිගන්නේද;

(ii) මෙම නිලධාරිනියන්ට ආයතන සංග්‍රහය අනුව හිමි විය යුතු ප්‍රසූත නිවාඩු ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

519/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු නොදියුණු තාක්ෂණික උපකරණ මඟින් නිවැරදි කාලගුණික අනාවැකි ලබාගැනීම ගැටලුවක්ව පවතින බව දන්නේද;

(ii) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මානව සම්පත් ඌනතාවයක් පවතින්නේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුවට නවීන තාක්ෂණික උපකරණ ලබාදීමට සැලසුම් කර තිබේ නම්, එම උපකරණ කවරේද;

(ii) එම නවීන උපකරණ භාවිතා කර සිදු කරනු ලබන කාර්යයන් කවරේද;

(iii) එම උපකරණ සඳහා වැය වන මුදල කවරේද;

(iv) එම නවීන උපකරණ මිලදී ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

677/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනය වියළි කලාපයේ ඇති වැදගත් කෘෂි වගා පර්යේෂණ මධ්‍යස්ථානයක් බව පිළිගන්නේද;

(ii) වර්ෂ 2010 සිට 2018 දක්වා එහි පර්යේෂණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කාලය තුළදී සොයාගත් භෝග වර්ග කවරේද;

(ii) එම පර්යේෂණ කෘෂි ආර්ථිකයට බලපානු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අගෝස්තු 08 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

53/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය බලයට පත් වූ දින සිට අද දක්වා පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශයේ "පුරනැගුම" වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලැබූ සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා ඒ සඳහා වැයකරන ලද මුදල කොපමණද;

(iii) ඌව පළාතේ සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

101/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.12.31 දිනට උසාවිවල නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් අධිකරණ වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) වසර 5කට වැඩි කාලයක් නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(iv) වසර 10කට වැඩි කාලයක් නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(v) ඉතා පහසුවෙන් විසඳිය හැකි නමුත් දීර්ඝ කාලයක් තුළ නොවිසඳී ඇති නඩු කඩිනමින් විසඳීම සඳහා පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

156/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඌව පළාතේ ඌන සංවර්ධිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) දැනට එම ව්‍යාපෘතියට තෝරාගෙන ඇති ගම්මාන කවරේද;

(iv) මේ වනවිට එම එක් එක් ගම්මානය දියුණු කිරීමට ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;

(v) අදාළ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලබාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(vi) ටෙන්ඩර් ලබාදීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

271/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවන ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

374/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු රොක්වුඩ් වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

502/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ කොළඹ ගං වතුර පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පවරා ගනු ලැබූ ජල රක්ෂිත ප්‍රදේශවලට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ පවරා ගනු ලැබූ ඉඩම් විකුණා තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) නාවල, කිරිමණ්ඩල මාවතේ පිහිටි පිඹුරුපත් අංක 41/SLLRDC දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් ඉඩම විකිණීමට පෙර දීර්ඝ කාලීන බදු පදනම මත පවරා දීමට කටයුතු කර තිබේද;

(iv) එම ඉඩම පෙර අයිතිකරුවන්ගෙන් පවරා ගනු ලැබූ පදනම කවරේද;

(v) ඉඩම පවරා ගැනීමේදී ඉඩම හිමිකරුට වන්දි ගෙවීමක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

7.

578/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්යබල නිෂ්පාදනයන් සඳහා රජය විසින් සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එම වැඩපිළිවෙළ යටතේ පාරිභෝගිකයන්ට ලබා දෙන ණය සඳහා ගෙවිය යුතු පොළී ප්‍රතිශතය කොපමණද;

(iii) මෙම වැඩපිළිවෙළ යටතේ එක් එක් බැංකුව විසින් පාරිභෝගිකයන් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය සහ එම ණය මුදල්වල එකතුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

604/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහජන ආධාර ලබා දෙනු ලබන්නේ කිසිදු ආදායමක් නොමැති රෝගී හෝ ආබාධිත තත්ත්වයේ පසුවන පුද්ගලයන්ට හෝ පවුල්වලටද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 143 බී, නුගදණ්ඩ ග්‍රාම නිලධාරි වසමේ, පුද්ගලයන් 23 දෙනෙකුට මහජන ආධාර ලබා දෙන බවත්, ඔවුන් අතරින් 05 දෙනෙකුට මාසිකව රු. 300/- බැගින්ද, අනෙක් අයට රු. 250/- බැගින්ද ලබා දෙන බව පිළිගන්නේද;

(ii) මෙම මුදල එම පවුල් සඳහා එක දිනයක වියදමටවත් නොසෑහෙන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම අසරණ පවුල් සඳහා ලබා දෙන නාමික දීමනාව වෙනුවට රු. 1000/- හෝ දීමනාවක් ලබාදීමට එකඟවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

611/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල ප්‍රමාණයන් සහ නාමයන් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2017 දක්වා කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සිදුකිරීම සඳහා බදු පදනම යටතේ ලබා දී ඇති සියලු ඉඩම්වල නාමය, ප්‍රමාණය හා එම ඉඩම් පිහිටි ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට සක්‍රිය මට්ටමේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) වසර 3කට වඩා වැඩි කාලයක් ගත වී ඇති, යෝජිත ව්‍යාපෘති කවරේද;

(iv) මෙතෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපොහොසත්ව ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් බදු පදනම යටතේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ලබා දී ඇති ඉඩම් බොහොමයක අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමෙන් ඵලදායී කාර්යයකට යෙදවීමට හැකිව තිබූ එම ඉඩම් අවභාවිතයට ලක්ව ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) මෙතෙක් ව්‍යාපෘති සිදුකර නොමැති ඉඩම් නැවත කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

657/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ නගරයේ වාරිමාර්ග යාන්ත්‍රික වැඩපොළ අසල සිට සම්පත් බැංකුව පිහිටා ඇති ස්ථානය දක්වා වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් භූමියේ ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යනු ලබන පුද්ගලයන්ගේ නම, ලිපිනය, එම එක් එක් පුද්ගලයා විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරය සහ ඔවුන් එම ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපාරික භූමිය වෙනුවෙන් බදු හෝ වෙනයම් අය කිරීමක් සිදු කරන්නේ නම්, ඒ කෙසේද;

(iii) එම අයකිරීම් සිදු කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

750/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටි මෙරට පුරවැසිභාවය ලබාගත් මෑත ඉන්දියානු සම්භවයක් (Recent Indian Origin) ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) වර්ෂ 1948 සිට 1995 දක්වා සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම යටතේ ඉන්දියානු පුරවැසිකම ලබා හෝ ලබා ගැනීමට ඉන්දියාව බලා පිටත් වී ගිය මෙරට පදිංචි වී සිටි මෑත ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටි ශ්‍රී ලංකා පුරවැසිකම ලබා ගත් ඉන්දියානු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිට ඉන්දියානු පුරවැසිකම ලබාගෙන හෝ ලබාගැනීම සඳහා ඉන්දියාවට පිටත්වී ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

775/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ රජයේ ඉදිකිරීම් සිදුකිරීම සඳහා හඳුනාගත් වෘත්තීය සුදුසුකම් ලත් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ක්ෂේත්‍රයේ ඉදිකිරීම් සිදුකිරීමට එම කොන්ත්‍රාත්කරුවන් සතු විය යුතු මූලික වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) රජයේ ඉදිකිරීම් වෙනුවෙන් 2018 වර්ෂය තුළ රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) රජයේ ඉදිකිරීම් වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඉතිරිව ඇති මුදල කොපමණද;

(v) අදාළ ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වීම තුළින් එම ක්ෂේත්‍රයන්හි නියැලෙන කොන්ත්‍රාත්කරුවන් දැඩි මූල්‍ය අපහසුතාවයට ලක්වන බවත්; ඒ හේතුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු බිඳ වැටීම ජාතික ආර්ථිකයට අහිතකර අන්දමින් බලපාන බවත් පිළිගන්නේද;

(vi) අදාළ කොන්ත්‍රාත්කරුවන්ට එම හිඟ මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

837/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් චිත්‍රපටි සංරක්ෂණය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) ඒ අනුව සංරක්ෂණය කර ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණද;

(iii) එම අංශයේ නිලධාරින්ට හා සේවකයන්ට චිත්‍රපටි සංරක්ෂණය සඳහා විදේශ පුහුණුව ලබාදෙන්නේද;

(iv) එසේ නම්, විදේශ පුහුණුව සඳහා යොමු කරනු ලබන ආයතන කවරේද;

(v) පසුගිය කාලය තුළ විදේශ පුහුණුව ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

880/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික පරිභෝජනය සඳහා අවශ්‍ය වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණය සපුරා ගනු ලබන ආකාරය කවරේද;

(iii) දේශීය නිෂ්පාදනයෙන් පමණක් අවශ්‍ය මිරිස් ප්‍රමාණය ලබා ගත නොහැකි බව පිළිගන්නේද;

(iv) වර්ෂ 2013 සිට 2018 දක්වා දේශීය වශයෙන් වගා කරන ලද මිරිස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2017 දක්වා වෙළෙඳපොළට සැපයූ දේශීය වියළි මිරිස් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම කාලය තුළ සැපයුමේ අඩුවීමක් හෝ වැඩිවීමක් පෙන්නුම් කරන්නේද;

(iii) අඩු වීමක් නම්, එය වර්ධනය කරගැනීමට පියවර ගන්නේද;

(iv) වැඩි වීමක් නම්, එය වැඩි දුරටත් දියුණු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

967/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් දෙපාර්තමේන්තුව විසින් 'අනුග්‍රාහක අරමුදල' නමින් අරමුදලක් පවත්වාගෙන ගිය බවත්;

(ii) එම අරමුදල සඳහා සේවයේ නියුක්ත නිලධාරින්ගේ වැටුපෙන් මුදල් අයකර ගත් බවත්;

(iii) මහනුවර, අම්පිටියේ, ගල්තැන්න පාරේ, අංක 08 හි පදිංචි හිටපු පොලිස් පරීක්ෂක ඩබ්. එච්. එම්. කරුණාතිලක බණ්ඩා මහතා දැනට වසර 07 කට පෙර විශ්‍රාම ගත් අවස්ථාවේදී මෙම අරමුදලින් තමන්ට හිමි මුදල අයදුම් කරමින් ලේඛන භාර දී ඇතත්, මෙතෙක් ගෙවීම් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කරුණාතිලක බණ්ඩා මහතාගෙන් අයකරගෙන ඇති රුපියල් 12,328/-ක මුදල ආපසු ඒ මහතාට ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) වසර ගණනාවක් රඳවාගත් මෙම මුදල වෙනුවෙන් පොළියක් ගෙවන්නේද;

(iii) එසේ නම්, එම ගෙවීම් සිදු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 අගෝස්තු 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

45/'18

ගරු හේෂා විතානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් අවසන් වරට ඉන්ධන මිල ඉහළ දැමූ දිනය කවරේද;

(ii) එම දිනය තුළ කොළොන්නාවෙන් හා මුතුරාජවෙල තොග ගබඩා පර්යන්තයෙන් ඉන්ධන නිකුත් කරනු ලැබූ බවුසර් සංඛ්‍යාව හා ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙසේ අඩු මිලට ඉන්ධන බෙදා හැරීම හේතුවෙන් එම දිනය තුළ පමණක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ පාඩුව කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විශාල පාඩුවක් සිදු වූ මෙම සිද්ධිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

103/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තේ වතු වර්ගීකරණය යටතේ බෙදා ඇති කාණ්ඩ කවරේද;

(ii) එක් එක් කාණ්ඩයෙන් අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) තේ වතුවලට අදාළ ඉඩම් වෙනත් ව්‍යාපෘති සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ට ලබා දීමට කටයුතු යොදා තිබේද;

(iv) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අදාළ ඉඩම් ලබා ගනු ලබන පෞද්ගලික ව්‍යවසායකයන්ගේ තොරතුරු සභාගත කරන්නේද;

(ii) වෙනත් ව්‍යාපෘති සඳහා ලබා දීමට යෝජිත ගංගා ජල පෝෂක ප්‍රදේශවල පිහිටි තේ වතු කවරේද;

(iii) ආරක්ෂිත පාරිසරික කලාපවල පිහිටි අතිශය සංවේදී ඉඩම් බෙදාදීමට කටයුතු යොදා තිබේද;

(iv) වෙනත් ව්‍යාපෘති සඳහා ව්‍යවසායකයන්ට ලබාදීමට යෝජිත හෝ ලබා දී ඇති තේ වතු පාඩු ලැබීමට හේතු කවරේද;

(v) කළමනාකරණයේ දුර්වලතාවය හේතු කොට ගෙන එම තේ වතු පාඩු ලබන්නේ නම්, නිසි කළමනාකරණයක් යටතේ ලාභ ලැබිය හැකි තත්ත්වයට ගෙන ඒමේ හැකියාවක් නොපවතින්නේද;

(vi) එසේ නම්, වෙනත් කටයුතු සඳහා ලබා නොදී තේ වගාවම පවත්වාගෙන යාම පරිසර හිතකාමී නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

157/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ගමනාගමන මණ්ඩලය සතුව පවතින ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල්වල ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් පිරවුම්හලින් ලැබුණු ආදායම, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී, ලංකා ගමනාගමන මණ්ඩලය සතු පිරවුම්හල් සංඛ්‍යාව වැඩි කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

272/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කටුගහගල්ලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා පාරිසරික අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පාරිසරික අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු කවරේද;

(v) අදාළ ඇස්තමේන්තුවේ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(vi) මෙම ප්‍රතිසංස්කරණයේදී වැවෙහි ගැඹුර හා වර්ගඵලය වැඩි කිරීම වෙනුවෙන් වැව් පතුලේ පස් තට්ටු ඉවත් කිරීමක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එම පස් තට්ටු, ඉවත් කරන ලද ආකාරය සහ බැහැර කරන ලද ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

375/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හෝප් වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

473/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහි කුමන්ත්‍රණ චෝදනාවකට ලක්ව සිටින නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතාගේ සේවා කාලය තුළ විෂමාචාර හෝ වෙනයම් චෝදනා එල්ල වී තිබුනේ නම්, එකී සිද්ධිය, දිනය, ගෙන ඇති විනය හා වෙනත් නෛතික ක්‍රියාමාර්ගවල තීන්දු හා ඒවායේ පිටපත් ලබා දෙන්නේද;

(ii) ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ, නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස ඔහු කරන ලද සේවාවල නිරවද්‍ය හා නිර්පාක්ෂිකභාවය පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iii) චෝදනා එල්ල වී ඇත්තේ රටේ නායකයාට හා ත්‍රස්තවාදය විනාශ කළ ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම්වරයාට එරෙහි කුමන්ත්‍රණයකට බැවින්, එම නිලධාරියා අනිවාර්ය නිවාඩු යැවීමෙන් පමණක් සාධාරණ පරීක්ෂණයක් සිදු කෙරෙනු ඇතැයි සෑහීමකට පත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

503/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සිට 2017 දක්වා එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම් සඳහා සහභාගි කළ ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සාමසාධක රාජකාරි සඳහා තෝරා ගන්නා නිලධාරීන් සඳහා වර්තමානයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නිර්දේශයක් අවශ්‍යයැයි ආරක්ෂක අමාත්‍යාංශය නියෝග කර තිබේද;

(iii) උක්ත නිලධාරීන් පිළිබඳව සොයා බලා එක්සත් ජාතීන්ගේ සංවිධානයට නිර්දේශ කිරීමට වඩාත් සුදුසු රාජ්‍ය ආයතන තිබියදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එය පැවරූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 සිට මේ දක්වා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරින්ගේ නිශ්කාෂණ වාර්තා ලබාදීම සඳහා කොමිසමට යැවූ ලිපිගොනු සංඛ්‍යාව සහ නිශ්කාෂණ ලබා දුන් ලිපිගොනු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සාමසාධක රාජකාරි සඳහා සහභාගි වන සංඛ්‍යාව සීඝ්‍රයෙන් අඩුවී ඇති බව දන්නේද;

(iii) එයට හේතු කවරේද;

(iv) 2018 මාර්තු මාසයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත ලබා දුන් ලිපිගොනු 400න් මේ දක්වා නිශ්කාෂණ වාර්තා ලබා දී ඇත්තේ ලිපිගොනු 07කට පමණක් බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

579/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආගමික ස්ථාන සඳහා සූර්යබල කට්ටල ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ විදුලි බලය ලබා දී ඇති ආගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආගමික ස්ථානයට සපයන ලද විදුලි පද්ධතියේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) 2017.06.01 දින වනවිට එම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම සූර්යබල කට්ටල මඟින් උත්පාදනය කරනු ලබන විදුලිබල ප්‍රමාණය කොපමණද;

(v) ආගමික ස්ථානවලට සූර්යබල කට්ටල නොමිලේ ලබාදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

605/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය හෝ එහි නියෝජිත ආයතන විසින් විසන්ධි කරන ලද විදුලි සැපයුමක් නැවත සන්ධි කිරීමට රු.1300/- ක මුදලක් අය කරන්නේද;

(ii) මීට වසරකට පෙර මෙම ගාස්තුව රු. 500/-ක් වූ බව පිළිගන්නේද;

(iii) මෙම ගාස්තුව ඉහළ නැංවීමට හේතුව කවරේද;

(iv) ගාස්තුව ඉහළ නැංවීම ගණනය කළ පදනම කවරේද;

(v) විදුලි බිල්පතෙහි හිඟයක් ඇති විට එය කොටස් වශයෙන් ගෙවීමට ඉඩ නොදෙන්නේ මන්ද;

(vi) වර්ෂ 2005 සිට 2018 දක්වා කාලය තුළ බිල්පත් නොගෙවීම හේතුවෙන් විදුලිය විසන්ධි කළ නිවාස/ස්ථාන සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

614/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, උලපනේ, මොරගොල්ලේ ප්‍රදේශයේ ඉදිවන ජලවිදුලි බලාගාරයේ ප්‍රධාන වේල්ලට මුල්ගල තබන දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩ නිමකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) නැවත පදිංචි කිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ඉදිවෙමින් පවතින ජල විදුලි බලාගාර අතරින් මෙම විදුලි ව්‍යාපෘතිය, මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ ඉදිවන ජලවිදුලි බලාගාරයට පමණක් දෙවැනි වන බවත්;

(ii) එහි ධාරිතාවය මෙගාවොට් 30ක් පමණ වන මෙම බලාගාරය ජාතික විදුලිබල පද්ධතියට වර්ෂයකට විදුලි ඒකක මිලියන 100ක් පමණ එක් කරමින් විදුලි පාරිභෝගිකයන් වෙනුවෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට නියමිත බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

751/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.07.01 සිට 2018.12.31 දක්වා අග්‍රාමාත්‍යවරයා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එම එක් එක් සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, ඔවුන් රජයේ තනතුරක් දරන්නේ නම්, එම තනතුරු සහ සංචාරයට සහභාගී වීමට හේතු කවරේද;

(iii) 2016.01.01 සිට 2018.12.31 දින දක්වා අග්‍රාමාත්‍යවරයා සහභාගී වූ විදේශ සංචාර සඳහා රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම් ද ඇතුළුව එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

776/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 සිට 2018 අගෝස්තු 30 දින තෙක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ආනයනය කරනු ලැබූ වෛද්‍ය උපකරණ හා ඖෂධ සඳහා වැය වූ ආනයනික පිරිවැය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) වර්ෂ 2016 සිට 2018 අගෝස්තු 30 දින තෙක් ඉන්දියාවෙන් ආනයනය කළ වෛද්‍ය උපකරණ හා ඖෂධ සඳහා වැය වූ පිරිවැය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) දේශීය සැපයුම්කරුවන්ගෙන් ඖෂධ ඇතුළු වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී සිදු කරනු ලබන ටෙන්ඩර් පටිපාටිය විධිමත් දැයි පිළිගන්නේද;

(iv) එසේ නම්, 2018 වර්ෂය තුළ දේශීය වශයෙන් සැපයුම් සිදුකළ සමාගම්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනය කරනු ලබන ඖෂධ භාවිතයට නුසුදුසු හෝ නියමිත ප්‍රමිතියෙන් තොර වන්නේද යන්න පරීක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2016 සිට 2018 අගෝස්තු 30 දක්වා කාලය තුළ එසේ හඳුනාගත් ඖෂධ හා උපකරණවල ආනයනික පිරිවැය කොපමණද;

(iii) නිසි ප්‍රමිතියෙන් තොර ඖෂධ වෙළෙඳපොළට නිකුත් වී රෝගීන්ගේ භාවිතයට ලැබීම බරපතළ සෞඛ්‍ය ගැටලු ඇති කරන්නක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

881/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ දේශීය වියළි මිරිස් වගාවේ ස්වර්ණමය යුගය දිවංගත අග්‍රාමාත්‍ය සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ යුගය බව පිළිගන්නේද;

(ii) මිරිස් ගොවීන් මිරිස් වගාවෙන් ඉවත් වීම හේතුවෙන් වියළි මිරිස් නිෂ්පාදනය බරපතළ ලෙස කඩා වැටුණු බව පිළිගන්නේද;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ මිරිස් වගාව නැවතත් දියුණු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

974/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශාල ප්‍රදේශයක නඩු කටයුතු ආවරණය කරනු ලබන මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය දැනට ඉතාමත් පැරණි අබලන් තත්ත්වයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන බව දන්නේද;

(ii) මෙම අධිකරණ ගොඩනැගිලි නවීකරණය කිරීමට හෝ නව ගොඩනැගිලි ඉදි කිරීමට හෝ කිසියම් පියවරක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1009/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 අප්‍රේල් මාසයේදී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් රිසීවරයක් හා ඇන්ටනා ස්කැනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට යවා තිබූ නමුත් එම භාණ්ඩ අස්ථානගත වී ඇති බව පිළිගන්නේද;

(ii) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගත් සමාගම කවරේද;

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iv) එම සමාගම තවමත් ශ්‍රී ලංකාවේ කවර හෝ රාජ්‍ය ආයතනයකට සේවා සපයන්නේද;

(v) එම භාණ්ඩ අස්ථානගත වීමෙන් සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 11 /'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා. 12/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 13/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 14/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් සලකා බලන කල මුහුදු සීමාවෙන් දුරස්ථව පිහිටා ඇති බැවින්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 15/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් සිදුවී ඇති පරිසර හානිය අවම කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් පරිසරයට දැඩි හානියක් සිදුවී ඇති බැවින්, එම පරිසර හානිය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 16/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා, — මහනුවර රෝහල් පරිශ්‍රයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,— යහපාලන රජය යටතේ මහනුවර රෝහල දෙවැනි ජාතික රෝහල ලෙස දියුණු කිරීමට පියවර ගනිමින් සිටින බැවින්, එම රෝහල් පරිශ්‍රයේ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 17/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අයහපත් කාලගුණය නිසා ඇතිවන වසංගත තත්ත්වයන් ව්‍යාප්තවීම වැළැක්වීම,— අයහපත් කාලගුණය නිසා ඇතිවන ජල ගැලීම් වලින් පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවල ජලය බැස යාමත් සමඟ මී උණ, පාචනය ඇතුළු බෝවන රෝග පැතිරයාමේ අවදානමක් පවතින බවට අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් පෙන්වා දී ඇති බැවින්, එවැනි වසංගත තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා. 18/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම,— කෘෂිකාර්මික රටක් වන අප රටෙහි ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂි කර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගාවල ජලයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේදී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 19/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාවට දක්ෂතා දක්වන විශාල පිරිසක් සිටින බැවින් එම පිරිස ජාත්‍යන්තර තලයට ගෙන යාමට හැකිවන අයුරින් මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 20/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 21/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා. 22/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා. 23/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංඟා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංඟා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 24/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 25/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— වර්තමානයේ ලෝකයේ ජලජ පැළෑටි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, එමගින් අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ පුළුල් අවස්ථාවක් උදා වී ඇති අතර, මෑතකදී ජපන් විශේෂඥයන් විසින් සිය පර්යේෂණ වාර්තාවක ජලජ පැළෑටි වගාව සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශය ඉතා යෝග්‍ය බව පෙන්වා දී ඇති පසුබිමක ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 26/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාත තුළ මේ වනවිට පිළිකා රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගී ජනතාව වෙනුවෙන් වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 27/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ළමා රෝහල වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ පවතින දැඩි තදබදය අවම කිරීම සඳහා මෙන්ම, වයඹ හා උතුරු මැද පළාතේ ජනතාවට ප්‍රයෝජනවත් වන පරිදි වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා. 28/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කිරීම,— යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට අපේක්ෂා කරන බැවින්, එම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා. 29/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — කල්පිටිය ආශ්‍රිතව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— වයඹ පළාතේ කල්පිටිය ප්‍රදේශයේ තල් ආශ්‍රිත කර්මාන්ත පසුගිය වසර කිහිපය තුළ දරුණු කඩා වැටීමකට ලක් වී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව, ඉදිරියේදී කල්පිටිය ප්‍රදේශය සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව එම ප්‍රදේශයේ තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා. 30/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා. 31/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා. 32/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා. 33/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා. 34/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ වකුගඩු රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෑත කාලීනව විශාල ලෙස වකුගඩු රෝගය පැතිරීම ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගීන් වෙනුවෙන් වයඹ පළාත තුළ රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා. 35/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැලසීමියා රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩිම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර, තවමත් එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෙනම රෝහලක් ස්ථාපිත කර නොමැති බැවින්, එම රෝගීන් සඳහා වෙනම රෝහලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා. 36/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ වැඩිම විහාරස්ථාන සංඛ්‍යාවක් පිහිටා ඇති, ස්වාමින්වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින, බෞද්ධයන් වැඩිම පිරිසක් වාසය කරන හා ශාසනාරක්ෂක බල මණ්ඩල වැඩිම සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතින වයඹ පළාතෙහි ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා. 37/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා. 38/'19

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා. 39/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා. 40/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වහිදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

31.

පා. 41/'19

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා. 42/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

33.

පා. 43/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායි විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

34.

පා. 44/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

35.

පා. 45/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

36.

පා. 46/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

37.

පා. 47/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කිරීම, — කොළඹ නගරය සහ එහි තදාසන්න නගර පරිපාලනය සඳහා කොළඹ, කඩුවෙල සහ කෝට්ටේ යනුවෙන් මහ නගර සභා තුනක් පැවතිය ද, මෙම මහ නගර සභා බල ප්‍රදේශ තුනටම මායිම්ව ඇති කොළොන්නාව මැතිවරණ කොට්ඨාසය පාලනය වන්නේ ප්‍රාදේශීය පරිපාලන ඒකක දෙකක් වන කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යටතේ වන බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම ආර්ථික, සමාජයීය හා සංස්කෘතික විෂමතාවන් ඇති කිරීමට මෙය හේතු වී ඇති අතර, අවට පවතින මහ නගර සභා, පරිපාලනයේ කාර්යක්ෂමතාව මත ශීඝ්‍ර සංවර්ධනයක් මේ වනවිට ළඟා කර ගෙන ඇති බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම සංවර්ධනය අරමුණු කර ගනිමින් කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව එකාබද්ධ කර කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

38.

පා. 49/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බුලත් වගාව නඟා සිටුවීම,— ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල විශාල පිරිසකගේ ජීවනෝපාය වන බුලත් වගාව, රටට විදේශ විනිමය ගෙන එන කෘෂිකාර්මික බෝගයක් වන අතර, ශ්‍රී ලංකාවෙන් බුලත් මිලදී ගන්නා ප්‍රධාන රටක් වන පාකිස්ථානය මෑතකදී එරටට ආනයනය කරන බුලත් සඳහා පනවන ලද බදු මෙන්ම, වගාවට දේශීයව බලපාන්නා වූ කරුණු ගණනාවක් හේතු කොට ගෙන දේශීය බුලත් මිල ඉතාමත් පහළ මට්ටමකට වැටී ඇති පසුබිමක බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ද අක්‍රමවත් වී ඇති බැවින්, මෙම තත්ත්වයන් හමුවේ අසීරුතාවයට පත්වී සිටින බුලත් ගොවීන් නඟා සිටුවීමටත්, අවශ්‍ය අපනයන දිශාවන් සොයා ගැනීමටත් අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම වඩා කාර්යක්ෂම කිරීම මඟින් බුලත් වගාව නඟා සිටුවීම සඳහා පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

39.

පා. 50/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු මඟින් රටේ පුරවැසියන්ට විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා ණය ලබා දීමේදී දේපළ ඇප මෙන්ම, පුද්ගල ඇප ද තබා ගන්නා අතර මෙහිදී ඇපකරු ණයගැතියා වෙත සිදුකරන්නේ උපකාරයක් වුවත්, යම් හෙයකින් ණයගැතියා ණය ගෙවීම පැහැර හැරියහොත්, ණයගැතියා ඇතුළුව ඇපකරුවන්ගේ නම් ද ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනයට ඇතුළත් කිරීමෙන් ඇපකරුට බලවත් අසාධාරණයක් සිදුවන අතර ගනුදෙනුව සම්ප්‍රථයකට පත්වන තුරු ඇපකරුට බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් හමුවේ රටේ නව ව්‍යවසායකයන් බිහිවීමට මෙන්ම, දළ ජාතික නිෂ්පාදිතයට ද අහිතකර ලෙස බලපෑම් සිදුවිය හැකි බැවින් ඇපකරුවන් සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

40.

පා. 51/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වා ගෙන යෑමේ අරමුණින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම,— ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන විශාල වශයෙන් පිහිටුවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ක්‍රමවත් අධ්‍යාපනය රටක සංවර්ධනයට උපකාරී වන බැවින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල බිහිවීම පැති කිහිපයකින්ම රටට හිතකර වන නමුත් මෙම ආයතනවලින් ලබාදෙන සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා වන පරිදි පිළිගත් ප්‍රමිතියකින් යුතුව ලබාදීම ඉතා වැදගත් බැවින් පළපුරුදු විද්වතුන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ මැදිහත් වීම තුළින් අදාළ පාඨමාලාවල අන්තර්ගතය විමසුමකට ලක්කරමින් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් සිදුවන සේවාව උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා දැනට පවතින නීති පද්ධතිය ශක්තිමත් නොවන හෙයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

41.

පා. 52/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික මූල්‍ය ආයතන පවත්වාගෙන යාමට අදාළ පනත් සංශෝධනය කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම,— පෞද්ගලික මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේදී තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවන අවස්ථා ඇති බැවින්, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මූල්‍ය සමාගම්වල ව්‍යාපාරික කටයුතු සිදුකර ගෙන යාමට ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන ශක්තිමත් නොවන හෙයින්, 2007 අංක 7 දරන සමාගම් නීතිය සංශෝධනය කොට බුන්වත් නීතිය ශක්තිමත් කිරීම කඩිනමින් සිදුකර ඊට සහාය සඳහා 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත, 2011 අංක 1 සහ 19 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් සංශෝධනය කිරීම තුළින් රට තුළ ශක්තිමත් මූල්‍ය අංශයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

42.

පා. 53/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිසි ප්‍රමිතියෙන් යුතුව සුළු අපනයන බෝග නිෂ්පාදනය කිරීම,— සුළු අපනයන බෝග නිෂ්පාදනය නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකිරීම මගින් වගාකරුවන්ට මෙන්ම, රටට ද අහිතකර ලෙස බලපෑම් ඇතිවන අතර, රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා අපනයන වැඩිකර ගැනීම උපකාරී වන නමුත්, ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝගවලට ජාත්‍යන්තරයේ තිබූ ඉහළ කීර්ති නාමය ගොරකාවලට යූරියා මිශ්‍ර කිරීම වැනි කූඨ ක්‍රම හේතුවෙන් පළුදු වී ඇති අතර මෙරට නිෂ්පාදිත සුළු අපනයන බෝග සඳහා ඇති විදේශීය ඉල්ලුම අඩුවීමෙන් දේශීය මිල ද පහත වැටී ඇති පසුබිමක මෙම තත්ත්වය වහා වෙනස් කර නිෂ්පාදනය කරන සුළු අපනයන බෝගවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

43.

පා. 54/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය හඳුන්වාදීම සහ ස්ථාපිත කිරීම,— දිවයිනේ ඇති වාණිජ බැංකු මගින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීමෙහිලා ලබා දෙන මූල්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බැවින් ලෝකයේ දියුණු රටවල භාවිතා වන ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම මගින් නව ව්‍යවසායකයන් බිහිවීමේ ප්‍රවණතාවය ඉහළ යා හැකි අතර නව අදහස් සමඟ බැංකුවට පැමිණෙන තරුණ ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාව තේරුම් ගෙන ඔවුනට මූල්‍ය පහසුකම් පමණක් නොව ව්‍යාපාරික දැනුම හා නිරන්තර රැකවරණය ලබා දීම මෙම බැංකු ක්‍රමයේ ඇති විශේෂතා වන අතර, එමගින් රැකියා උත්පාදනය සමඟ ජාතික නිෂ්පාදිතය වැඩිවීමෙන් රටේ සංවර්ධනයට ද උපකාරී වන බැවින් ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

44.

පා. 55/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන අධීක්ෂණයට භාජනය කිරීම,— දිවයිනේ බොහෝ ස්ථානවල ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ව්‍යවසායකයන් බිහිවීම රටට හිතකර වුවත්, එයින් සමාජයට යහපතක් සිදුවිය යුතු බැවින්, බොහෝ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානවල සිදුවන විෂමාචාර ක්‍රියා වැළැක්වීම සඳහා මෙන්ම, එමගින් සමාජයීය වශයෙන් ප්‍රතිලාභ සහිත හිතකර තත්ත්වයක් ඇති කිරීම සඳහා මෙම ආයතන ලියාපදිංචි කිරීමට බලය ඇති ආයතන සහ පලාත් පාලන ආයතන මගින් ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයට භාජනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

45.

පා. 56/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා, — "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය වූ ජන කොටස ඉදිරි සංගණන වලදී "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණනය කිරීම,— ඉන්දියාවෙන් මෙරටට රැගෙන එන ලද ඉන්දියානුවන් "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය කෙරෙන අතර වර්තමානයේදී ඔවුන් "කඳුරට දෙමළ" ලෙස තමන්ව හඳුන්වා ගනිමින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය පූර්ණ වශයෙන් භුක්ති විඳින නමුත් "ඉන්දියානු දෙමළ" ලෙස හැඳින්වීමෙන් ඔවුන්ගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රශ්න කෙරෙන ස්වභාවයක් ඇති බැවින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියට සිදුකෙරෙන සංගණනවලදී මෙම ජන කොටස "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණන කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

46.

පා. 57/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කිරීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

47.

පා. 58/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය තුරන් කිරීමට කඩිනම් පියවර ගැනීම,— ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ආක්‍රමණශීලී ශාක විශේෂයන් ගණනාවක් ව්‍යාප්ත වෙමින් පවතින අතර යම් යම් සංවිධාන සහ පුද්ගලයන් විසින් දිවයිනේ මංමාවත් දෙපස, සුසාන භූමිවල සහ ක්‍රීඩා පිට්ටනි ආදී පොදු ස්ථානවල රෝපණය කරන ලද ඇකේෂියා වැනි ශාක හේතුකොටගෙන මී මැසි ප්‍රජාවගේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වී ඇති බව එම ප්‍රදේශවල සිදුකරන ලද පර්යේෂණවලින් සනාථ වී ඇති බැවින්, ශාක මෙන්ම, සත්ත්ව ප්‍රජාවගේද පැවැත්මට ප්‍රබල තර්ජනයක් වී ඇති මෙවැනි ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය වළක්වා මුළුමනින්ම තුරන් කිරීමට කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

48.

පා. 59/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට දීර්ඝ ඉතිහාසයක් පවතින අතර පසුගිය වසර 25ක කාලය තුළ ඔයිල් පාම් ප්‍රමුඛ නව බෝග වගාවන් වැවිලි ක්ෂේත්‍රයට ඇතුළත් වී ඇති අතර පුද්ගලීකරණයට ලක්වී ඇති වැවිලි ක්ෂේත්‍රයේ නොමනා කළමනාකරණය හේතුවෙන් මෙම ක්ෂේත්‍රය පරිහානියට පත්වී කම්කරුවන්හට පවා විශ්වාසයෙන් යුතුව තම රැකියාවන්හි නිරත වීම සඳහා වන ආර්ථික සමාජ පරිසරයක් එහි දක්නට නොමැති බැවින්, අප රටේ ප්‍රධාන අපනයන ආදායම් ක්ෂේත්‍රයක් වන වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය දැනට සිදුකර ඇති පෞද්ගලීකරණයෙන් ඉවත් කොට රජයේ මැදිහත්වීම යටතේ නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දී ඒවා තිරසාරව පවත්වාගෙන යාමට රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

49.

පා.63 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සිනමා ඇකඩමියක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලාංකීය සිනමා කර්මාන්තය මේ වනවිට 70 වැනි වසර පසු කරමින් සිටින අතර ජාත්‍යන්තර සිනමා උළෙල ජය ගැනීමට තරම් දක්ෂ චිත්‍රපට අධ්‍යක්ෂකවරුන්, නළු නිළියන් ඇතුළු නිර්මාණ ශිල්පීන් බිහි කිරීමට ශ්‍රී ලංකාව සමත්ව තිබුණ ද, එය විෂයයක් ලෙස අනාගත පරපුර වෙත විධිමත්ව ගෙන යාම සඳහා අප රටට තවමත් සිනමා ඇකඩමියක් නොමැති බැවින්, වෘත්තීය සිනමාවක් බිහිකර ගැනීමේ අරමුණ සහිතව සිනමා ඇකඩමියක් කඩිනමින් ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

50.

පා. 64 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නූතන කලාගාරයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ Modern Art හෙවත් නූතන කලාවේ නිරත ශිල්පීන් අප රටේ සිටිය ද, ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා නූතන කලාගාරයක අඩුවක් පවතින අතර, එවැනි කලාගාරයක් මඟින් අපගේ චිත්‍ර හා මූර්ති ශිල්පය ඇතුළු කලා කටයුතු පෝෂණය මෙන්ම, සංචාරක ව්‍යාපාරයේ වැඩි දියුණුව ද සිදුවන බැවින්, එවැනි නූතන කලාගාරයක් (Modern Art Gallery) කොළඹ ආශ්‍රිතව ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

51.

පා. 65 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හෙවත් ඊ - අපද්‍රව්‍ය අප රටට බරපතළ අනතුරක් නිර්මාණය කරමින් තිබෙන අතර දැනට වාර්ෂිකව මෙට්‍රික් ටොන් 92,000ක පමණ ඊ - අපද්‍රව්‍ය ජනනය වන අතර, වර්ෂ 2020 වනවිට එය මෙට්‍රික් ටොන් 120,000 දක්වා වැඩිවෙතැයි අපේක්ෂා කෙරෙන අතර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ඒවා බැහැර කිරීම සහ එහි ඇති පාරිසරික හා සෞඛ්‍යමය අනතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් හා අඛණ්ඩ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

52.

පා. 66/'19

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— මතභේදයට තුඩු දී ඇති "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කිරීම,— රටේ මහත් ආන්දෝලනයකට තුඩු දී ඇති හිරා පදනම මඟින් ආරම්භ කර ඇති "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ එම ආයතනය මඟින් ඉදිකිරීමට යෝජිත දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට අනුමතිය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනය සමාජයේ දැඩි විවේචනයට ලක්වෙමින් පවතින අතර මෙයට ඉඩම් ලබා දී ඇති සහ මුදල් ආධාර ලැබී ඇති ක්‍රමවේදය ඇතුළු යම් යම් ක්‍රමවේදයන් සම්බන්ධයෙන් පැන නැඟී ඇති කරුණු සැලකිල්ලට ගෙන ශරියා විශ්වවිද්‍යාලයක් ලෙස පටබැඳි නාමයකින්ද හඳුන්වන "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ ඊට සම්බන්ධ සියලු ගොඩනැගිලි රජයට පවරාගෙන රාජ්‍ය විශ්වවිද්‍යාලයක් බවට පත්කර එය "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

53.

පා. 67/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ත්‍රස්තවාදීන්ට හා ත්‍රස්තවාදී සංවිධානවලට සම්බන්ධ වූ අයට මරණ දඬුවම ලබාදීම සහ ඔවුන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීම,— ජාත්‍යන්තර හෝ දේශීයව ත්‍රස්තවාදයට සම්බන්ධ ත්‍රස්තවාදීන්ට මෙන්ම, එම ත්‍රස්තවාදී සංවිධානවලට සහ ක්‍රියාකාරීන්ට ඍජුව හෝ වක්‍රව ආධාර, උපකාර, අනුබලදීම් කරන පුද්ගලයන්ගේ එකී ක්‍රියාකාරකම් පිළිබඳව අධිකරණයෙන් ඔප්පු වූ අවස්ථාවකදී, ඔවුන් සතු සියලු දේපළ රාජසන්තක කොට මරණ දඬුවම ලබාදිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

54.

පා. 68 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා ගැනීම,— දැනට මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දිවයිනේ පිහිටි සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් වහාම අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරාගෙන මෙම පාසල් තුළ විෂයයක් ලෙස සිංහල ඉතිහාසය ඉගැන්වීමටත්, එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

55.

පා. 69 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ආගම් සහ ජාතීන් අනුව වර්ග නොවන මිශ්‍ර පාසල් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ඉදිරි වසරේ සිට ක්‍රමානුකූලව මිශ්‍ර පාසල් බවට පත්කිරීමටත්, සිංහල, දෙමළ, මුස්ලිම්, කතෝලික යනුවෙන් පාසල් ස්ථාපිත කිරීමට අනාගතයේදී ඉඩ නොදීමටත්, ජාතීන් අනුව යම් ප්‍රතිශතයක් යටතේ පාසල් වෙත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

56.

පා. 70 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වය සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුළ ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කොට දැනට එසේ ජාතීන් හෝ ආගම් නමින් ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂවල නාමයන්ද වෙනස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

57.

පා. 71 /'19

ගරු තිලංග සුමතිපාල මහතා,— "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම,— පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පැන නැගී ඇති බැරෑරුම් තත්ත්වය හමුවේ විශේෂයෙන්ම බහුතර ප්‍රජාවගේ ආරක්ෂාව පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවට ඉදිරියේදී එවැනි අවස්ථාවන් ඇති නොවීමටත්, විශේෂයෙන්ම අන්තවාදී මත දරන්නන්ගෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ මෙන්ම, සමස්ත ශ්‍රී ලංකාවම ආරක්ෂා කර ගැනීමටත්, "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2019 අගෝස්තු 20 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

37/'18

ගරු හේෂා විතානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් පෞද්ගලික බවුසර් රථ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන් සතු බවුසර්වල අංක කවරේද;

(iii) පසුගියදා සිදු වූ ඉන්ධන මිල ඉහළ යැමට සාපේක්ෂව, ඔවුන්ගේ ප්‍රවාහන ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් එම සංගමයේ සාමාජිකයන් දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

68/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ස්ථාන සඳහා 2015 වර්ෂයේ සිට බඳවා ගත්,

(i) ස්ථිර සේවකයන් සංඛ්‍යාව;

(ii) අනියම් සේවකයන් සංඛ්‍යාව;

(iii) කොන්ත්‍රාත් පදනමට අයත් සේවකයන් සංඛ්‍යාව;

(iv) අනියම් සේවකයන්ගෙන් ස්ථිර සේවයට ඇතුළත් කරගන්නා ලද සේවකයන් සංඛ්‍යාව;

(v) කොන්ත්‍රාත් පදනමට අයත් සේවකයන්ගෙන් ස්ථිර සේවයට ඇතුළත් කර ගන්නා ලද සේවකයන් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම බඳවාගැනීම් රජය පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදුකර තිබේද;

(ii) මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

142/’18

ගරු වමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පාසලේ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව හා ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීම, ශිෂ්‍යයන්ගෙන් මුදල් අයකිරීම වැනි කටයුතු නියාමනය කිරීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

230/’18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ, නාවුල බෝවතැන්න ජලාශය අවට යෝධ නිදිකුම්බා ශාකය ව්‍යාප්ත වෙමින් පවතින බවත්;

(ii) එම නිසා ගොවි ජනතාවට දැඩි දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුවනු ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

244/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

341/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි H කලාපයේ ඇති සියලුම කුඹුරුවලට ජලය සපයන ඇළ වේලි දීර්ඝ කාලයක සිට ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් ජලය අපතේ යාමෙන් ගොවිතැන් කටයුතුවලට නිසියාකාරව ජලය ලබා ගැනීමට නොහැකි වී ඇති බව දන්නේද;

(ii) මෙම ඇළ වේලි ඇතුළු වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

372/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු නාගස්තැන්න වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

462/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා විදේශ ගත වූ වයඹ පළාත් සභාවේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ විදේශ ගතවූ නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(iii) ඔවුන් විදේශගත වූ රටවල් කවරේද;

(iv) ඒ සඳහා වැයකරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදේශ සංචාර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී, වයඹ පළාත් සභාව අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

488/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් බඳවා ගැනීම, ගාස්තු අයකිරීම වැනි කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

501/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.01 දින සිට 2018.01.31 දින දක්වා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට සැපයූ ආහාර වර්ග කවරේද;

(ii) එම ආහාර සැපයීම සිදු කළ සැපයුම්කරුවන්ගේ, උප සැපයුම්කරුවන්ගේ සහ ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ආයතන අතරින් කූට ලේඛන ඉදිරිපත් කරමින් හා ප්‍රසම්පාදන නියෝගවලට බැහැරව කටයුතු කළ ආයතන කවරේද;

(iv) ප්‍රසම්පාදන කමිටු අනුමතියකින් තොරව භාණ්ඩ මිලදී ගැනීමට උපදෙස් ලබාදුන් නිලධාරීන් හා භාණ්ඩ ඇනවුම් කළ නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(v) නීති විරෝධී මිලදී ගැනීම් හේතුවෙන් රජයට සිදු වූ අලාභය කොපමණද;

(vi) එම අලාභය අදාළ පුද්ගලයන්ගෙන් හා ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

535/'19

ගරු බිමල් රත්නායක මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ පිටත වටරවුම් පාර ඉදිකිරීමේදී කඩුවෙල, රග්ගහවත්ත ප්‍රදේශයේදී කැළණි ගඟේ වම් සහ දකුණු ඉවුරුවල අඩි 4ක් පමණ පස් කපා ඉවත්කර, කොන්ක්‍රීට් කණු ඉදිකර ඇති බවත්;

(ii) සෑම වසරකම පාහේ ගංවතුර උවදුරට ලක්වන රග්ගහවත්ත, හේවාගම යන ප්‍රදේශ මෙම හේතුව නිසා විශාල ගංවතුර උවදුරකට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගං ඉවුර කැපීම හේතුවෙන් දැඩි ගංවතුර උවදුරකට ලක්වීමෙන් ප්‍රදේශයේ ජනතාවට සිදු වන හානිය වැළැක්වීම පිණිස කපා දැමූ ඉවුර යථා තත්ත්වයට පත්කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

555/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ,

(i) ස්ථිරව පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව සහ ඔවුන්ට අයත් ඉඩම් පිළිබඳව දන්නේද;

(ii) සින්නක්කර ඉඩම් ඔප්පු හිමි පවුල්/පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) සින්නක්කර ඔප්පු සහිත ගොඩ ඉඩම් සහ කුඹුරු ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉඩම් බලපත්‍ර හිමි පවුල්/පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉඩම් බලපත්‍ර සහිත කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අවුරුදු 60කට වැඩි කාලයක් ජීවත්වන ජනතාවට මෙතෙක් සින්නක්කර ඉඩම් ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) යුද්ධයෙන් හානියට පත් කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ජනතාවට තම ඉඩම් බැංකු හෝ වෙනත් මූල්‍ය ආයතන වෙත උකස් තැබීම, ණය ලබා ගැනීම වැනි ක්‍රියාමාර්ග තුළින් තම ආර්ථික කටයුතු දියුණු කර ගැනීමට නොහැකිව සිටින බව දන්නේද;

(iii) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ මෙතෙක් සින්නක්කර ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර හෝ නොමැතිව ජීවත් වන පවුල්/පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

563/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය මාසවල වයඹ පළාතේ දැඩි නියඟයක් පැවති බව දන්නේද;

(ii) එසේ නම්, එම කාලසීමාව තුළ ගල්ගමුව මැතිවරණ කොට්ඨාසයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නියං සහනාධාර ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට ලබා දුන් සහන මල්ලේ තිබූ වියළි ආහාරවල මිල ගණන් වෙළෙඳපොළේ මිලට වඩා ඉහළ බවට චෝදනාවක් නැගී ඇති බව දන්නේද;

(v) එසේ නම්, මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

593/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා 288 හි සඳහන් කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවන් මුහුණ දී සිටි අර්බුදයන් කවරේද;

(ii) උක්ත අර්බුදයන් විසඳීම සඳහා, රජයේ මැදිහත් වීම සිදු වූ ආකාරය කවරේද;

(iii) වර්ෂ 2014 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වූ තැරැව්කරුවන් සංඛ්‍යාව; ඔවුන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය සහ එක් එක් වර්ෂයේ තැරැව්කාර ගණුදෙනු ප්‍රමාණය දැක්වෙන දත්ත වගුවක් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iv) 2016 වර්ෂය තුළදී ඒකාබද්ධ වූ කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

944/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගරයේ සිට කිලෝ මීටර් 40ක පමණ දුරින් පිහිටි දෙල්තොට නගරයේ වෙසෙන ජනතාවට අධිකරණ කටයුතු සඳහා මහනුවර නගරයට පැමිණීමේදී මුහුණපාන අපහසුතා හා දුෂ්කරතාවයන් මගහරවා ගැනීමේ අරමුණින් දෙල්තොට ප්‍රදේශයට සංචාරක අධිකරණයක් පිහිටුවීමට යෝජනාවක් ඉදිරිපත් වී තිබූ බවත්;

(ii) ඒ සඳහා මධ්‍යම පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන දැනට වසා දමා ඇති පාසැල් ගොඩනැගිල්ලක් ලබා දීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එකඟත්වය පළකර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) පාතහේවාහැට හා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ අවට පදිංචි ජනතාවගේ අධිකරණ කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගෙන දෙල්තොට නගරයේ සංචාරක අධිකරණයක් පිහිටුවීම සඳහා පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 අගෝස්තු 21 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

32/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ මේ වනවිට වර්ෂ 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පොලිස් සැරයන් නිලයට පත්කිරීමේදී දැනට ක්‍රියාත්මක ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් කොස්තාපල්වරුන් අතරින් සැරයන් නිලයට උසස්වීම් ලැබීමට සුදුසුකම් සපුරා ඇති කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) සුදුසුකම් සපුරා ඇතත්, උසස්වීම් නොලැබුණු පොලිස් කොස්තාපල්වරුන්ට උසස්වීම් ලබාදීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

75/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා,

(i) ශ්‍රී ලංකන් ගුවන් සමාගම හරහා ආගමනය හා විගමනය කළ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) පියාසර කළ වාර සංඛ්‍යාව;

(iii) එම ගුවන් සමාගම උපයන ලද ආදායම;

(iv) ලබන ලද ලාභය හෝ පාඩුව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලාභයක් සිදුවූයේ නම්, එම අලාභවලට හේතු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

129/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්‍ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

212/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

334/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබාදීමේදී ගැටලු රාශියක් ඇති බවත්;

(ii) මේ වනවිට සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබා ඇති පුද්ගලයන්ට සමෘද්ධි සහනය නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, සමෘද්ධි සහනාධාර ලබාදීමේ ගැටලු විසඳනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

354/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගම්පහ පොලිස් ස්ථානයේ අංක 248/177/MOIB හා 2017.02.13 දිනැති පැමිණිල්ලට අදාළ සැකකරු සමඟ, අංක EP-JA-7555 දරන Toyota Noah වර්ගයේ මෝටර් රථය, Samsung වර්ගයේ ජංගම දුරකථන දෙකක්, Nokia වර්ගයේ ජංගම දුරකථනයක්, ජාතික හැඳුනුම්පත් සහ රියදුරු බලපත්‍ර කීපයක් සහ මුදල් සහිත ගමන් මල්ලක් සිවිල් පුද්ගලයන් කීපදෙනෙකු විසින් 2017.05.01 දින කළුතර දිසා අපරාධ කොට්ඨාසය වෙත භාරදෙන ලද බවත්;

(ii) නීති විධිවිධානවලට පටහැනිව එකී සැකකරු 2017.05.01 දින සිට 2017.05.06 දින දක්වා පානදුර පොලිස් ස්ථානයේ රඳවා තබා සිටි බවත්;

(iii) ඉහත සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන මෙන් එවකට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක MLO/ MO/OUT/147/17 හා 2017.08.29 දිනැති ලිපිය මඟින් පොලිස්පතිවරයාට දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සිද්ධිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සහ එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) අගතියට පත් පැමිණිලි පාර්ශ්වයට සාධාරණයක් ඉටු කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

408/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වසර 8 කට වැඩි කාලයක් සේවය කර ඇති උප පොලිස් පරීක්ෂකවරුන්ට පොලිස් පරීක්ෂක තනතුර ලබාදෙන බවට හිටපු විෂය භාර අමාත්‍යවරයා විසින් ජනමාධ්‍යයට ප්‍රකාශ කළ බව පිළිගන්නේද;

(ii) එම උසස්වීම් මේ දක්වා ලබා නොදීමෙන් එම නිලධාරීන් කනස්සල්ලට පත් වී ඇති බව දන්නේද;

(iii) එබැවින් පොරොන්දු වූ පරිදි එම උසස්වීම් ලබාදීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම උසස්වීම් බලාත්මක වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

441/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018.09.01 දින වනවිට කළුතර දිස්ත්‍රික්කය තුළ සිටින හඳුනාගත් ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව, ආබාධයේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආබාධිත තත්ත්වයන් සිදුවී ඇත්තේ උපතින්ද; නැතහොත්, අනතුරකින්ද යන්න සහ වයස අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) එම එක් එක් ආබාධිත පුද්ගලයාගේ නම, ලිපිනය, භාරකරුගේ නම, ග්‍රාම නිලධාරි වසම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආබාධිත පුද්ගලයන් ලබාගන්නා ආධාර මුදල් ප්‍රමාණය හා ඔවුන්ගේ ආබාධයේ ස්වභාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ආධාර ලැබිය යුතු එහෙත්, ආධාර නොලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පිරිස වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

495/’19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් සභාවට අයත් මාර්ග සංඛ්‍යාව හා ඒවායේ මුළු දිග කිලෝමීටර් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව පළාත් සභා ප්‍රතිපාදන මත සංවර්ධනය කරනු ලැබූ මාර්ගවල නම් කවරේද;

(iii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iv) දැනට අබලන් තත්ත්වයේ පවතින සෙසු පළාත් සභා මාර්ග සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

515/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ‘‘සහභාගිත්ව සංවර්ධන වැඩසටහන්’’ යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන් සඳහා මාසික වැටුපක් හෝ දීමනාවක් ගෙවන්නේ නම්, ඒ කොපමණද;

(iv) එසේ බඳවාගත් එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයත් වන ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන තොරතුරු අඩංගු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

553/’19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන පෙර පාසැල්වල ගුරුවරුන් සඳහා එම දෙපාර්තමේන්තුව විසින් වැටුප් ගෙවනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් සංඛ්‍යාව, වැටුප් ගෙවනු ලබන පෙර පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව සහ එක් ගුරුවරයෙකුගේ මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම පෙර පාසැල්වල ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ගේ නිල ඇඳුම් සඳහා මුදල් දෙමාපියන්ගෙන් අය කරනු ලබන බව දන්නේද;

(iii) නිල ඇඳුම් සඳහා එක් ශිෂ්‍යයෙකුගෙන් අයකරනු ලබන මුදල කොපමණද;

(iv) එම ගාස්තුව දෙමාපියන්ගෙන් අය කිරීමේ පදනම කවරේද;

(v) මෙම ශිෂ්‍යයන්ගේ පාසැල් නිල ඇඳුම්වල හමුදා ලාංඡනය මුද්‍රණය කර ඇති පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙසේ ආරක්ෂක හමුදාව විසින් පෙර පාසැල් පවත්වාගෙන යනු ලැබීමෙන් පශ්චාත් යුද සමයක සංහිඳියාව, ජාතික සමගිය සහ එකමුතුව යන කාරණා සඳහා බලපෑමක් ඇති නොවන්නේද;

(ii) උතුරු පළාත් සභාවට අයත් මෙම පෙර පාසැල් ආරක්ෂක හමුදාව විසින් පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

586/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 209ට අනුව, හම්බන්තොට වරාය හරහා යන මුහුදු මාර්ගයෙහි, වාර්ෂිකව තෙල් නැව් 4,500 ක් ඇතුළු නෞකා 35,000 භාවිතා කරනු ලබන බව සඳහන් කර, ගැඹුරු මුහුදේ තෙල් සැපයීමේ කාර්යයට පිවිසීමට පෞද්ගලික අංශය දිරි ගන්වන බවට යෝජනා කළ බව පිළිගන්නේද;

(ii) උක්ත යෝජනාව ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්කිරීම සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත යෝජනාව අනුව, එකී කාර්යයට බලපත් ලබාදීම සඳහා විනිවිදභාවයෙන් යුත් ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබුවේද;

(iv) ඒ අනුව, ගැඹුරු මුහුදේ තෙල් සැපයීමට බලපත් ලබාගත් පාර්ශ්වකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

683/'18

ගරු කනක හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාකිස්ථාන ජාත්‍යන්තර ගුවන් සමාගමකට කල්බදු ක්‍රමය (Wet lease) යටතේ ගුවන් යානයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ගුවන් යානය පැයකට කල් බදු ලබා දී ඇති මුදල කොපමණද;

(iii) මෙම ගිවිසුම් ගතවීම කොපමණ කාලයක් සඳහා වලංගු වන්නේද;

(iv) ඒ සඳහා මෙතෙක් අයවිය යුතු මුළු මුදල ලැබී තිබේද;

(v) නොඑසේ නම්, ලැබී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කල්බදු ක්‍රමය යටතේ තවත් ගුවන් යානා සඳහා ගිවිසුම් ගත වී තිබේද;

(ii) නොඑසේ නම්, ගිවිසුම් ගතවීමට සූදානම්ව සිටින්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

694/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී රාජ්‍ය ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදනයේ (GDP) ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී ඒක පුද්ගල රාජ්‍ය ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

764/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් අවශ්‍යතා වෙනුවෙන් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මහවැලි ගඟේ මඩන්නට්ටි මංකඩෙහි කියුබ් 100ක වැලි කැණීම් බලපත්‍රයක් සෘජුවම එම දෙපාර්තමේන්තුවට ලබාදී තිබියදීත්, බලපත්‍ර ලබා නොදිය යුතු සාහිනගර් තොටුපළින් වැලි ලබා ගැනීම සඳහා බාහිර පුද්ගලයෙකුගේ නමට අංක C483984 දරන බලපත්‍රය ලබාදීමට හේතු කවරේද;

(ii) සාහිනගර් තොටුපළෙන් ලබා ගන්නා වැලි රොන්මඩ සහිත බැවින් පිරිසිදු කළයුතු අතර මෙම තොටුපළින් කණින ලද වැලි කොපමණ ප්‍රමාණයක් මේ වනවිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ලබාගෙන තිබේද;

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට වැලි ලබාදීමට බාහිර පුද්ගලයෙකු සම්බන්ධකර ගැනීම සඳහා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතිය ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අගෝස්තු 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

54/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලද ග්‍රාමීය පාලම් 500 ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයෙන් තෝරාගෙන ඇති පාලම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ දැනට අබලන් වී ඇති අනෙකුත් පාලම් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

95/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජයට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සපයනු ලබන සමාගම් කවරේද;

(ii) ඒ සඳහා මාසිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(iii) එම සමාගම් විසින් හිඟයකින් තොරව අදාළ සේවාව රෝහල්වලට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභාවලට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සපයනු ලබන සමාගම් කවරේද;

(ii) පළාත් සභාවලට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සැපයීම සඳහා මාසිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(iii) එම මුදල් සෘජුව පළාත් සභා වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන්නේද;

(iv) ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල කොපමණද;

(v) ඒ සඳහා පළාත් රෝහල්වලට වාර්ෂිකව අවශ්‍ය වන මුදල කොපමණද;

(vi) අදාළ මුදල් නියමිත කාල සීමාව තුළ දී ලැබී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

155/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් නිවාස සහ ව්‍යාපාරික ස්ථානවලට හානි සිදුවීමෙන් පීඩාවට පත්ව සිටින ජනතාවට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ගැනෙන කරුණු සම්බන්ධයෙන් සහන ලබා දීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

222/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ, උප පොලිස් පරීක්ෂක තනතුරේ දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) බඳවාගැනීම් කාර්යපටිපාටියට අනුව ඔවුන්ට පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම් ලබාදිය යුත්තේ කවර කාලයකින් පසුවද;

(iii) ඒ අනුව නියමිත කාලසීමාව සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂවරුන්ට උසස්වීම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

273/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි “රාත්‍රි වැව” ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා ලබාගත් පාරිසරික සහ වෙනත් අනුමැතීන් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු කවරේද;

(iv) අදාළ ඇස්තමේන්තුවේ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ප්‍රතිසංස්කරණයේදී වැවෙහි ගැඹුර හා වර්ගඵලය වැඩි කිරීම වෙනුවෙන් වැව් පතුලේ පස් තට්ටු ඉවත් කිරීමක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එම පස් තට්ටු, ඉවත් කරන ලද ආකාරය සහ බැහැර කරන ලද ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

361/’18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හන්තාන වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා.අරමුදල්, සේ.අ.අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

459/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මෑතකදී විසුරුවා හරින ලද වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පැවති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වූ ආයතන සඳහා බඳවාගනු ලැබූ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවාගත් තනතුරු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එසේ සේවකයන් බඳවා ගැනීමට පළාත් සභාව අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

580/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවල පැවති දැඩි නියඟය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) පීඩාවට පත්වූ එම පවුල් පිළිබඳ වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නියඟය නිසා පීඩාවට පත් වූ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

606/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 93/2, නුවර පාර, යක්කල ලිපිනයේ පිහිටි සිලෝන් සෝලා පවර් පුද්ගලික ආයතනය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි ආයතනයක්ද; නොඑසේ නම්, අසාධු ලේඛනගත ආයතනයක්ද;

(ii) එම ආයතනයේ ලියාපදිංචිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2017.03.14 වැනි දින අත්හිටුවා තිබේද;

(iii) මෙම අත්හිටුවීමට හේතුව එම සමාගම විසින් සවිකරණ ලද සූර්ය බලශක්ති උපකරණවල තත්ත්වය බාල වීමද; නොඑසේ නම්, ආයතනයේ අභ්‍යන්තර හේතුවක්ද;

(iv) මෙම ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවා ඇත්නම්, ඒ සඳහා නීතිමය පියවරක් නොගෙන අධිකාරිය ඒ සඳහා මැදිහත් වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචිය අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස එම ආයතනයේ ස්ථිරව හා කොන්ත්‍රාත් පදනමින් සේවය කළ 40කට ආසන්න පිරිසකගේ රැකියා අහිමිවී ඇති බව දන්නේද;

(ii) මෙම ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවා ඇත්තේ තාවකාලිකව නම්, ඒ සම්බන්ධයෙන් අදාළ අංශ විසින් පරීක්ෂණ පවත්වා ආයතනය නිවැරදි නම්, නැවතත් ආයතනය පවත්වාගෙන යාමට අවසර ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

613/’18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යහපාලන රජය ආරම්භ වූ දින සිට 2018 අගෝස්තු මාසය දක්වා උදාගම් ව්‍යාපෘතිය යටතේ,

(i) ආරම්භ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව;

(ii) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව;

(iii) වැය කර ඇති මුළු මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාත තුළ,

(i) ආරම්භ කර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

(ii) නිවාස ව්‍යාපෘති ආරම්භ කර ඇති ස්ථාන;

(iii) වැඩ නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව;

(iv) වැයකර ඇති මුළු මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී උදාගම් නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

753/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට සහාය දීම හේතුවෙන් ආරක්ෂාව සැලසිය යුතු බවට අධිකරණ නියමයක් ලැබී ඇති සත්‍ය ගවේශකයෝ සංවිධානයේ ඉංජිනේරු නිශාන්ත ද අල්විස් මහතාට මෙතෙක් ආරක්ෂාව ලබා නොදීමට හේතුව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

777/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන දිවයින තුළ ක්‍රියාත්මක කිරීමේදී ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ පොලී සහනාධාර මුදල කොපමණද;

(ii) ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානය යොමු කළ ක්ෂේත්‍ර කවරේද;

(iii) "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන දිවයින තුළ ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගෙන ඇති රාජ්‍ය හා පෞද්ගලික බැංකු කවරේද;

(iv) ඉහත වැඩසටහනට සම්බන්ධවීම සඳහා ණය ඉල්ලුම් කළ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2018 වර්ෂය තුළ ඉහත සඳහන් පුද්ගලයන් වෙනුවෙන් මුදාහරින ලද ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) මෙම ජාතික වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

794/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය අවසානය වනවිට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වාහන අතරින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථා ආදියට පවරා තිබෙන වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම වාහන අතුරින් අනතුරුවලට ලක්වී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අතර අලුත්වැඩියා නොකරන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම වාහන නඩත්තු කිරීම සඳහා අධිකාරිය විසින් වැය කළ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14\.

882/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩා වැව්, 'ජපන් ජබර' වැනි ජලජ පැළෑටි මඟින් ආක්‍රමණය කිරීම හේතුවෙන් සීඝ්‍රයෙන් ගොඩ වී ගෙන යන බව දන්නේද;

(ii) එම ජලජ පැළෑටිවල ආක්‍රමණය 'කටියාව වැව' වැනි මධ්‍යම ප්‍රමාණයේ වැව්වලට ද ව්‍යාප්ත වී ඇති බව පිළිගන්නේද;

(iii) මෙම ජලජ පැළෑටිවල ආක්‍රමණය අනාගතයේදී වී වගාවට බලපෑමෙන් එය ජාතික ප්‍රශ්නයක් වීමට ඉඩ ඇති බව පිළිගන්නේද;

(iv) එම ජලජ පැළෑටි ආක්‍රමණය සම්පූර්ණයෙන් නතර කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15\.

965/'19

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, රත්මල්ගහවැව, නෙලුගොල්ලාකඩ පදිංචි එම්. එම්. ජවුෆර් මහතා ලංකා බැංකුවේ කහටගස්දිගිලිය ශාඛාවේ අංක 706863 දරන ගිණුම විවෘත කර විදේශ ගතවී 2006.06.01 සිට 2012 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ උපයා ගත් රුපියල් ලක්ෂ 50කට අධික මුදලක් ඉහත ගිණුමට බැර කර ඇති බවත්;

(ii) 2012 දෙසැම්බර් මස ලංකාවට පැමිණ තම ගිණුමේ මුදල් ලබාගැනීමට ජවුෆර් මහතා උත්සාහ කළ අවස්ථාවේ, රුපියල් ලක්ෂ 50කට ආසන්න මුදලක් වංචා සහගතව බැංකුවේ මුදල් කවුන්ටරයෙන් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) මඟින් ආපසු ලබාගෙන තිබූ බවත්, ඒ පිළිබඳ වහාම ලංකා බැංකුවට දැනුම් දී තම මුදල් ආපසු ගෙවන මෙන් ඉල්ලා සිටියද, මෙතෙක් එම මුදල් ආපසු ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජවුෆර් මහතාට මෙම මුදල් හා ඊට හිමිවිය යුතු පොළිය ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 අගෝස්තු 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

55/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ හදබිම අධිකාරිය නමින් ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් කවරේද;

(iii) දැනට එම කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නම හා ලිපිනය කවරේද;

(iv) මෙම ගොඩනැගිල්ලට මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුළිය කවරේද;

(v) මෙම ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේම ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

96/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසුව සිදු කරන ලද මාර්ග ඉදිකිරීම්වලදී දේපළ අහිමිවූවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා වන්දි ලබා දී ඇති දේපළ අහිමිවූවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන්දි ප්‍රමාදවීම් වෙනුවෙන් පොලියක් සමඟ වන්දි ගෙවීමට කටයුතු යොදා තිබේද;

(ii) මේ වනවිට පොලිය සමඟ වන්දි ගෙවීම් සිදු කර තිබේද;

(iii) ඒ සඳහා අපේක්ෂිත නිර්ණායක කවරේද;

(iv) පොලී අනුපාතය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට වන්දි ලබාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිරියේදී වන්දි ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

158/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මධ්‍යම රජයට අයත් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම රජය හා පළාත් සභාව, බදුල්ල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග නඩත්තුවට හා ප්‍රතිසංස්කරණයට වැය කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

274/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල නගරයට ඉහළින් පිහිටි මරගල ඔය කඳුවැටිය අයත් වනාන්තරය, රක්ෂිතයක් ලෙස නම් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මරගල ඔය කඳුවැටිය අයත් මෙම වන භූමිය පාරිසරික සංවේදී කලාපයක් ලෙස ගැසට් කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද?

(v) මරගල ඔය වනාන්තරට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) මෙම සංවේදී කලාපයේ හෝ රක්ෂිතයේ සීමා මායිම් ලකුණු කර තිබේද;

(vii) මෙම කඳු වැටියෙන් ආරම්භ වන ගංගා, ඇල, දොල සහ ඔයවල් කවරේද;

(viii) පසුගිය කාලයේ මෙහි ජල මූලාශ්‍රයක් වන "ජී ලෝන්" ජල රක්ෂිතය ආසන්නයේ අනවසර කටයුතු හේතුවෙන් බීමට ගන්නා ජල ව්‍යාපෘතියෙහි ජලය දූෂණයට ලක්වී ඇත්දැයි වාර්තා වී තිබේද;

(ix) මෙම වනයත්, ජල මූලාශ්‍රත් රැක ගැනීම වෙනුවෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

362/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු බෝපිටිය වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

527/’19

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්බලන්ගොඩ තිලකපුර, සිරිසුමනගම පදිංචි පවුල් 180කට නල ජල පහසුකම් ලබාදීම සඳහා 2017 වර්ෂයේදී තිලකපුර ප්‍රජා සංවර්ධන සමිතිය විසින් ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ජලනල එලා ජල ටැංකියද ඉදිකර ඇති බවත්;

(ii) 2017 වර්ෂයේ පෙබරවාරි මස මෙම ජල ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම ලබාදෙන බව පවසා තිලකපුර ප්‍රජා සංවර්ධන සමිතිය විසින් ප්‍රදේශවාසීන්ගෙන් රුපියල් 10,000/- ක මුදලක් එකතු කර ඇති බවත්;

(iii) මෙම ප්‍රදේශවාසීන්ගේ ළිං ජලයට වැසිකිළි ජලය මුසුවීම හේතුවෙන් සෞඛ්‍ය හා සනීපාරක්ෂක ගැටලු ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙතෙක් එම ජල සැපයුම ලබා නොදීමට හේතු කවරේද;

(ii) මෙම ප්‍රදේශවාසීන් සඳහා නල ජල පහසුකම් නොපමාව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

635/’18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාලවල පාලනාධිකාරියන්ට පෞද්ගලික සමාගම් සමඟ රහසිගතව ගිවිසුම් අත්සන් කිරීමට බලය දීමට හැකියාවක් තිබේද;

(ii) පර්යේෂණයක් ආරම්භ කිරීමට පෙර එහි ප්‍රතිඵලවල අගය තීරණය කිරීමට නොහැකි බැවින්, රුපියල් 100/- වැනි අවම මුදලකට එහි ප්‍රතිඵල පෞද්ගලික සමාගමකට ලබාදිය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මොරටුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් කෝඩ් ජෙන් නමැති පෞද්ගලික සමාගම සමඟ කෘතිම බුද්ධිය සම්බන්ධව පර්යේෂණයක් සඳහා 2017.02.06 දින ගිවිසුම් ගතවී තිබේද;

(ii) එකී ගිවිසුම අනුව පර්යේෂණයේ ප්‍රතිඵලය එම සමාගමට රුපියල් 100/- ක මුදලකට හිමි කරදීමට දෙපාර්ශ්වය එකඟ වී තිබේද;

(iii) මෙම ගිවිසුම අත්සන් කිරීමට පෙර එහි අන්තර්ගතය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල අධ්‍යයන මණ්ඩල දැනුම්වත් නොකළේ මන්ද;

(iv) මෙම ගිවිසුම හේතුවෙන් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වෙන්ව තිබූ දේශන ශාලාවක් අදාළ සමාගමේ පරිහරණයට ලබා දී තිබේද;

(v) එසේ නම්, ඒ කුමක් සඳහාද;

(vi) දේශන ශාලාවක් ලබා දීම ගිවිසුමේ අඩංගු වන්නේ මන්ද;

(vii) මෙම ගිවිසුම හා ඉන් ඇතිවන බලපෑම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමසුමට භාජනය කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

660/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණු කවරේද;

(ii) එහි කාර්යභාරයන් කවරේද;

(iii) පාරිභෝගික කටයුතුවලට අදාළව සිදු කරනු ලබන කුමන වැරදි සම්බන්ධයෙන් එම අධිකාරියට ක්‍රියා කළ හැකි වන්නේද;

(iv) අධිකාරියේ බලතල හා වැරදිකරුවන්ට එරෙහිව ගතහැකි ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂය තුළ එම අධිකාරිය විසින් සිදුකර ඇති,

(i) වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) සිදුකර ඇති දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව සහ ඒවා පැවැත්වූ ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුර ගමන් සේවා මගී ප්‍රවාහන බස් රථ නවත්වනු ලබන බොහෝ ආපනශාලාවල වැඩි මිලට ආහාරපාන අලෙවි කරමින් ගුණාත්මක භාවයෙන් අඩු ආහාරපාන අලෙවියේ නිරත වන බවත්, පාරිභෝගික වරණය සීමා වීම තුළ පාරිභෝගිකයන් මහත් අපහසුතාවයන්ට ලක් වන බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

754/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රිමාන්ඩ් බන්ධනාගාරගතව හෝ සිරගතව සිටින ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විවිධ තරාතිරම්වල නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගතව හා සිරගතව සිටින පිරිස්ද ඇතුළුව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති සියලු නිලධාරීන්ට එරෙහිව ගොනු වී ඇති චෝදනා සහ ඒවායේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ අතරින් මරණ දඬුවම ලබා සිටින නිලධාරීන්ගේ නම්, ලිපිනයන් හා එම තීන්දුවට අදාළ වරද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විවිධ චෝදනා ඉදිරිපත් කරමින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට සහය දුන් "සත්‍ය ගවේශකයෝ" සංවිධානයේ නිශාන්ත ද අල්විස් ඇතුළු විවිධ තරාතිරම්වල සිවිල් පුරවැසියන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

778/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක ජනතාවට ප්‍රතිලාභ සැලසීමට පසුගිය රජය ඉදිකිරීම් ආරම්භ කළ කරස්නාගල පානීය ජල යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් නතර වී ඇති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ව්‍යාපෘතිය ඉදිරියට සිදු කරගෙන යෑමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ව්‍යාපෘතිය නිමකර ජනතාවට ප්‍රතිලාභ ලබාදීමට සැලසුම් කළ දිනය ඉක්මවා බොහෝ කාලයක් ගත වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, මෙම ව්‍යාපෘතිය නිමකර එහි ප්‍රතිලාභ ජනතාවට ලබාදීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

795/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙනත් රාජ්‍ය ආයතනවලට බදු හෝ කුලී පදනම මත ලබා දී තිබෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොඩනැගිලි සහ ඒවාට අය කළ වාර්ෂික බදු හෝ කුලී මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගොඩනැගිලි අතරින් ගිවිසුමකින් තොරව ලබා දුන් ගොඩනැගිලි තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගිවිසුමකින් තොරව ගොඩනැගිලි ලබා ගත් පුද්ගලයන් කුලී මුදල් ගෙවා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

966/'19

ගරු බිමල් රත්නායක මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් අංක 2037/16 හා 2017.09.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ බවත්;

(ii) එමඟින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ වූ නියමය පරිදි රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් පිහිටුවීම පිළිබඳව නිවේදනයක් නිකුත් කළ බවත්;

(iii) මේ සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නා බව ප්‍රකාශ කළද මෙතෙක් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සම සෞඛ්‍ය විද්‍යා පීඨය පිහිටුවීම සඳහා අමාත්‍යාංශයෙන් මුදල් වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඒ අනුව මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

975/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේවල්පොල නගරයේ සිට දාවිවිහල්මිල්ලෑව දක්වා දිවෙන මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) ප්‍රදේශයේ විශාල ජනතාවක් ප්‍රයෝජනයට ගනු ලබන මෙම මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1010/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් රාජ්‍ය ආයතනයේ නම, හිඟ මුදල සහ හිඟ පවතින කාලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1028/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 දී ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා අංක 294 සහ 295ට අනුව, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ඩොලර් ලැයිස්තුගත වීම සඳහා විදේශීය සමාගම් උනන්දු කරවීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) යෝජනා අංක 295ට අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 28 සිට 50 දක්වා ඉහළ නංවනු ලැබුවේද;

(iii) අග්‍රාමාත්‍යවරයා විසින් කිහිපවිටක ප්‍රකාශ කළ පරිදි, "ප්‍රාග්ධන ලාභ බද්ද" හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේද;

(iv) 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කළ සුපිරි වාසි බද්ද, කොටස් වෙළෙඳපොළ සංවර්ධනයට ඉමහත් බාධාවක් වූ බව පිළිගන්නේද;

(v) අතීතයට බලපාන ලෙස බදු පැනවීමට අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 සැප්තැම්බර් 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

42/'18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා විදුලිය ලබා දීමට වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව මේ දක්වා එම වැඩසටහන යටතේ විදුලිය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී පළාත් සභාව විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

97/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම්වලට අදාළව ඔබ අමාත්‍යාංශය විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම්වලට අදාළ සම්මුඛ පරීක්ෂණවලදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ නිර්ණායක තිබේද;

(iii) එසේ නම්, එම නිර්ණායක සභාගත කරන්නේද;

(iv) ඉහත (ii) හි සඳහන් නිර්ණායක සකසා නොමැති නම්, ඉදිරියේදී එම නිර්නායක සැකසීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෑතකදී සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දුන් අයදුම්කාරියන් අපහසුතාවයට පත්වන ආකාරයේ පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ ප්‍රශ්න හා විෂය පථයට පරිබාහිර ප්‍රශ්න අසා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වයන් සිදුවී ඇති ස්ථාන කවරේද;

(iv) අදාළ අයදුම්කාරියන්ගේ මානුෂීය අයිතීන් කඩකිරීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

160/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "ගමකට වැවක්" වැඩසටහනේ අරමුණු කවරේද;

(ii) එම වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරාගෙන ඇති වැව් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික්කයෙන් වැඩිපුර වැව් සංඛ්‍යාවක් තෝරා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

275/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට මොණරාගල දිස්ත්‍රික්කයේ වාර්තාගත වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වසර පහක කාලය තුළ වකුගඩු රෝගයෙන් මිය ගොස් ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට මොණරාගල දිස්ත්‍රික්කය තුළ වකුගඩු රෝගීන් සඳහා සායන පවත්වාගෙන යනු ලබන රෝහල් කවරේද;

(iv) එම රෝහල්වල සායන සඳහා පසුගිය වර්ෂය තුළ ලියාපදිංචි වී සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඒ අනුව, මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩිම වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් සිටින ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(vi) 2016 හා 2017 වර්ෂවලදී රජය විසින් මෙම වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් සහ වකුගඩු රෝගය වළක්වා ගැනීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

364/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු දෙල්තොට වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

615/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය බලයට පත්වූ දින සිට මේ දක්වා මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ පානීය ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජල ව්‍යාපෘති පවතින ප්‍රදේශ හා පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2017 වර්ෂය තුළ නාවලපිටිය මැතිවරණ බල ප්‍රදේශවල ජලය ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන් අතරින් මේ වනවිට ජල සැපයුම් ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) නාවලපිටිය මැතිවරණ කොට්ඨාසයේ ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල වෙසෙන බොහෝ ජනතාවට පානීය ජලය නොමැතිවීම මත දැඩි පීඩාවන්ට හා අපහසුතාවයන්ට ලක්වීමට සිදුවී ඇති බව පිළිගන්නේද;

(v) එම ජනතාවගේ පානීය ජල ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

765/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහවැලි ගඟ මුහුදට වැටෙන ගෙන්ගේ පාලම දෙපසින් උප්පාරු හා රාල්කුලි පාලම් දෙක පිහිටා ඇත්තේ මහවැලි ගඟේ ශාඛා ජල මාර්ග දෙක මතින් බව එතුමා දන්නෙහිද ?

(ආ) (i) උප්පාරු ශාඛා ඇළ මහවැලි ගඟට සම්බන්ධ වන්නේ මහවැලි ගඟේ මඩන්තෙට්ටිවලට ඉහළින් හා රාල්කුලි ශාඛාව සම්බන්ධ වන්නේ මනල්ආරුවලින් වන නමුත්, ගෙන්ගේ කලපුවේ මුහුදු ජලය මහවැලි ගඟට මිශ්‍ර වීම වැළකෙන පරිදි පිහිටා ඇති වැලිපරයෙන් වැලි කැණීමට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ පරිදි ලබා දී ඇති වැලි කැණීම් බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එම බලපත්‍ර ලාභීන්ගේ නම්, ලිපිනයන් හා අනුමත වැලි කියුබ් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 ජූනි හා 2018 මැයි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය නිකුත් කර ඇති සමීක්ෂණ වාර්තා දෙකෙහි පිටපත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී වාර්තාවල නිර්දේශ අනුව වැලි කැණීම් බලපත්‍ර ලබාදීමට පවතින බාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

798/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපතිවරයා සහ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරුන්ගේ පරිහරණය පිණිස ලබා දී ඇති වාහන කවරේද;

(ii) එම වාහනවල ලියාපදිංචි අංක හා වාහන වර්ගය කවරේද;

(iii) ඒවා අතර කුලී පදනම හෝ බදු පදනම මත ලබාගත් වාහන තිබේද;

(iv) එසේ නම්, එම වාහනවල වර්ගය හා ලියාපදිංචි අංක කවරේද;

(v) 2016.01.01 සිට මේ දක්වා ඉහත (iv) හි සඳහන් එක් එක් වාහනය සඳහා මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

(vi) මේ දක්වා මෙම වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

810/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල නොවන අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වන ඉංජිනේරු, ගණකාධිකාරි සහ වෙනත් වෘත්තීයවේදී පාඨමාලා කවරේද;

(ii) එම ආයතනවල එක් එක් පාඨමාලාව සඳහා අයකරන ගාස්තු කවරේද;

(iii) අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාල මඟින් පවත්වාගෙන යනු ලබන ගාස්තු අයකරනු ලබන පාඨමාලා කවරේද;

(iv) එම පාඨමාලා සහ අයකරන ගාස්තු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2012 - 2015 කාලසීමාව තුළ ඉහත අ(ii) සහ අ(iv) පාඨමාලාවලට අදාළව ගාස්තුවල ඇති වූ වෙනස්වීම් කවරේද;

(ii) රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගේ ශිෂ්‍යාධාර රු.5000/- දක්වා වැඩි වී ඇති බව දන්නේද;

(iii) විවෘත විශ්වවිද්‍යාලයේ පාඨමාලා ගාස්තු වාර්ෂිකව 10%කින් ඉහළ ගියද, රු.312.50ක් වන මාසික ශිෂ්‍යාධාර මුදල වැඩිවී නොමැත්තේ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන තුළ පැවැත්වෙන සියලු පාඨමාලා (ප්‍රථම උපාධිය/ඩිප්ලෝමා) සම්පූර්ණයෙන් ගාස්තුවලින් නිදහස් කළ යුතු බව පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

855/'19

ගරු විමලවීර දිසානායක මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලින් විසින් මිනිස් ජීවිත හා දේපළ විනාශ කිරීම බහුලව සිදුවන බවත්;

(ii) එම ජීවිත හා දේපළ විනාශ කිරීම හේතුවෙන් පවුල් අනාථභාවයට සහ අසරණභාවයට පත්වන බවත්;

(iii) එසේ විනාශ වන ජීවිත හා දේපළ සඳහා වන්දි ගෙවීම දිගින් දිගටම ප්‍රමාද වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වන්දි මුදල් කඩිනමින් ගෙවීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

903/’19

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.12.10 දිනැති අංක 01/2010 චක්‍රලේඛය මඟින් ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරින්ට සහනදායී පදනම මත වාහන ආනයනයේදී දෙවැනි වාහනය ලබාගැනීම සඳහා ලබාදී තිබූ අවුරුදු 5ක කාලය 2016.07.14 දිනැති අංක 1/2016 චක්‍රලේඛය 2015.11.21 දින සිට ක්‍රියාත්මක කිරීමෙන් අවුරුදු 10 දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් මේ සඳහා 2016 වර්ෂය තුළ සුදුසුකම් ලැබූ නිලධාරින්ට දැඩි අසාධාරණයක් සිදුවූ බවත්;

(ii) 2018.06.08 දිනැති අංක 01/2018 (1) චක්‍රලේඛය 2018.06.09 දින සිට ක්‍රියාත්මක කරමින් එම කාලසීමාව නැවත අවුරුදු 5 දක්වා අඩු කිරීමෙන් 2016 වර්ෂයේ සිට 2018.06.08 දින දක්වා විශ්‍රාම ගිය නිලධාරින්ට එම හිමිකම අහිමි වූ බවත්;

(iii) ඉහත 01/2018 (1) චක්‍රලේඛයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයේ 2018.06.08 හෝ 2018.06.09 ලෙස දිනයන් සඳහන් නොවීමෙන් අනෙකුත් ආයතනවල සමාන මට්ටමේ විශ්‍රාමික නිලධාරින්ට හිමිව තිබූ රුපියල් මිලියන 3.6 ක් වටිනා බලපත්‍රය 01/2018 (1) චක්‍රලේඛය මඟින් මෙම නිලධාරින්ට අහිමිකර ඇති බවත්;

(iv) ඒ අනුව, 2016 වර්ෂයේ සිට 2018.06.08 දක්වා විශ්‍රාම ගැන්වූ, 2015 චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් සපුරා තිබූ සියලු නිලධාරින්ට මෙම බලපත්‍රය ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

930/’19

ගරු මුහම්මදු නසීර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, මහවැලි “සී” කලාපයේ පිහිටා තිබෙන එකම ජාතික පාසැල වන අම්/දෙහිඅත්තකණ්ඩිය මධ්‍ය මහා විද්‍යාලයේ 3000 කට අධික ශිෂ්‍යයන් සහ 150කට ආසන්න අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින පාසලක් බව දන්නේද;

(ii) 2015, 2016, 2017 සහ 2018 වර්ෂවලදී එම පාසලේ භෞතික සම්පත් සහ මානව සම්පත් අවශ්‍යතා සපුරාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම වාර්තාව අනුව එකී පාසලේ අවශ්‍යතා හඳුනාගැනීම සහ පාසල් පද්ධතියේ අවශ්‍යතා සපුරාදීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ (ii) අනුව හෝ දුෂ්කර ගම්මානවල ජීවත්වන දුප්පත් ළමුන්ගේ අනාගත යහපත උදෙසා හෝ එකී පාසැලේ දියුණුව පිණිස රේඛීය අමාත්‍යාංශය මඟින් විශේෂ අවධානය යොමු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

939/’19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) සහල් ආනයනය කිරීම සඳහා වැයකළ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කිරීම සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කළ ආකාරය කවරේද;

(iv) රාජ්‍ය ආයතන විසින් ආනයන කළ සහල් ප්‍රමාණයන් සහ එම ආයතන විසින් සහල් අලෙවියෙන් ඉපැයූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

968/’19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වේච්ඡා පොලිස් කොස්තාපල්වරුන් ලෙස සේවය කළ පුද්ගලයන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 9/1374/360/047 ට අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3–II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ බවත්;

(ii) එම පිරිස ගුරු හිඟයක් පැවති වැලිඔය වැනි දුෂ්කර ප්‍රදේශවල සේවයට යෙදවූ බවත්;

(iii) මේ හේතුවෙන් ගුරු හිඟය නිසා වැසී යාමට ආසන්නව පැවති එම ප්‍රදේශවල පාසල් යළි නඟා සිටුවීමට හැකිවූ බවත්;

(iv) එසේ වුවද, ඔවුන්ගේ විරෝධය නොතකා ඔවුන් යළි ස්වේච්ඡා පොලිස් සේවයට අනුයුක්ත කිරීමේ උත්සාහයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ගේ ඉල්ලීම පරිදි එම පිරිස ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

976/’19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ජනාකීර්ණ නගරයක් වන කැබිතිගොල්ලෑව නගරය සැලසුමකින් තොර ඉදිකිරීම්වලින් බහුල නගරයක් බව දන්නේද;

(ii) එම නගරය සැලසුම් සහගත නගරයක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 සැප්තැම්බර් 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

44/'18

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බළන්ගොඩ, රාස්සගල ප්‍රාදේශීය රෝහල නායයෑමේ අවදානමක් හේතුවෙන් වසා දමා තිබෙන බවත්;

(ii) දැනට රෝගීන්ට ප්‍රතිකාර කරනු ලබන්නේ රාස්සගල ආයුර්වේද මධ්‍යස්ථානයේ ඉහළ මහලේ බවත්;

(iii) ඒ හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන ජනතාව පීඩාවට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

98/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීම සඳහා ඉදිරිපත්ව සිටින නිලධාරින් දිරිමත් කිරීම සඳහා 2015 වර්ෂයේ සිට ගෙවා ඇති ත්‍යාග මුදල් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) මේ වනවිට කොපමණ නිලධාරින් සංඛ්‍යාවක් සඳහා එම ත්‍යාග මුදල් ගෙවා තිබේද;

(iii) දීමනා ගෙවිය යුතු ආකාරය පිළිබඳව නිර්ණායක පවතීද;

(iv) එසේ නම්, එම නිර්ණායක සභාගත කරන්නේද;

(v) ජීවිත පරදුවට තබා කටයුතු කරනු ලබන එම නිලධාරින් වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා/ත්‍යාග මුදල් වැඩි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම කාලසීමාවන් සහ ක්‍රමවේද සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

161/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, පළාත් පාලන ආයතන යටතේ පවතින මාර්ග පද්ධතියේ දුර කිලෝමීටර් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව ප්‍රතිසංස්කරණයට ලක් කරනු ලැබූ පළාත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සතු මාර්ග බොහොමයක් ඉතා දැඩි ලෙස අබලන් වී ඇති බැවින්, එම මාර්ග පද්ධතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

365/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ගලබොඩ වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

616/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, තෝරාගත් පාසැල් 35ක් සඳහා ක්‍රිකට් භාණ්ඩ ප්‍රදානය කිරීමේ උත්සවයක් 2018.10.02 වැනි දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්වූ බවත්;

(ii) එම උත්සවයට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලනය වෙනුවෙන් තරඟ සංවිධායක කමිටු ප්‍රධානියා ලෙස කටයුතු කළ බන්දුල දිසානායක නමැත්තෙකු සහභාගී වූ බවත්;

(iii) එම උත්සවය සඳහා ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිල ටයි පටියද පැළඳ සිටි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය කල් දමා නිසි බලධාරියෙකු යටතේ ක්‍රියාත්මක වූ එවැනි අවස්ථාවකදී හිටපු බලධාරියකුට මෙවැනි උත්සව සඳහා සහභාගී වීමට ඇති නෛතික හා සදාචාරාත්මක පසුබිම කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂිත නිලධාරින් යහපාලන රජයේ කටයුතු සඳහා සම්බන්ධ කරගැනීම වැළැක්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

799/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.09 දින සිට 2018.10.25 දින දක්වා කාලය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබුවේ කවුරුන්ද;

(ii) ඔහුට ගෙවන ලද මාසික දීමනාව කොපමණද;

(iii) ඔහුට ගෙවන ලද මාසික දුරකථන දීමනාව කොපමණද;

(iv) ඔහු විසින් ලබාගෙන ඇති මාසික ඉන්ධන දීමනාව හෝ ප්‍රවාහන දීමනාව කොපමණද;

(v) කුලී නිවසක් ලබාගෙන තිබේ නම්, ඒ සඳහා ගෙවා ඇති මාසික කුලිය කොපමණද;

(vi) මීට අමතරව, වෙනත් දීමනා ගෙවා තිබේ නම්, එම දීමනා මාසිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සභාපතිවරයා සඳහා කොපමණ වාහන සංඛ්‍යාවක් වෙන්කර තිබේද;

(ii) එම වාහන අතරින් අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) කුලී හෝ බදු පදනම මත වාහන ලබාගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

811/19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොහුවල හන්දිය දක්වා ගමන් කරන මාර්ග ඔස්සේ දැනට පදිකයන්ට ගමන් කිරීම සඳහා ඉඩකඩ වෙන්කර තිබේද;

(ii) දැඩි වාහන ගමනාගමනයක් සිදුවීම හේතුවෙන් තත්ත්වය උග්‍ර වී තිබේද;

(iii) මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2016 වර්ෂයේ සිට ගන්නා ලද පියවර කවරේද;

(iv) ඉහත කී මාර්ග වලට යාබද ඉඩම දේශපාලනඥයන්ට සහ ලයිසියම් විද්‍යාලයට අයත් වන හෙයින් එකී මාර්ග පුළුල් කිරීම කල් දමනු ලැබ තිබේද;

(v) මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදුකරනු ලබන්නේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේනම් , ඒ මන්ද?

8.

1019/’19

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ගැසට් කරන ලද කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාස හතරකට එක් අතිරේක උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙක් බැඟින් පත් කිරීමට කටයුතු යොදා තිබේද;

(iv) එසේ නම්, ඒ මන්ද;

(v) ප්‍රධාන රෝහල් සඳහා පත් කරන ලද වෛද්‍ය උප්පැන්න හා මරණ ලියාපදිංචි රෙජිස්ට්‍රාර්වරුන් සංඛ්‍යාව හා රෝහල් සංඛ්‍යාව කොපමණද;

(vi) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්ප්‍රදාය වෙනස් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 සැප්තැම්බර් 05 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

56/’18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යොවුන් දැල් පන්දු තරඟාවලියේදී තරඟ පාවා දුන් බවට චෝදනාවක් එල්ල වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පරීක්ෂණයේ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iv) එම තරඟ පාවා දුන් පුද්ගලයන්ට එරෙහිව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

104/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා රැකියා සඳහා මැද පෙරදිග රටවලට විදේශගත වූ ශ්‍රමිකයන්ගෙන් නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු මෙරටට නොපැමිණි සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලිවලට අදාළව සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව කොපමණද;

(iv) විමර්ශන සිදු නොකරන ලද පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිදු කරන ලද විමර්ශනවලින් නොපැමිණීමට හේතු සොයාගත් පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම හේතු කවරේද;

(iii) නොපැමිණීමට හේතු සොයා නොගත් පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) නොපැමිණීමට හේතු සොයා නොගත් පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

162/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාහනයේ අංකය කවරේද;

(iii) එම එක් එක් වාහනය ලබාදී ඇති නිලධාරින් හා අංශ කවරේද;

(iv) නගර සභාව සතු වාහන වෙනත් බාහිර ආයතන වෙත ලබාදී ඇත්නම්, එසේ ලබාදුන් නිලධාරින්ගේ හා ආයතනවල නම් කවරේද;

(v) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන වෙනත් පාර්ශ්ව වෙත ලබාදීමේදී යම් අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

276/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුප්පත්කම මනිනු ලබන ආර්ථික දර්ශක කවරේද;

(ii) ඒ අනුව, මේ වනවිට සිටින දුප්පත් ජනතාවගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකාවේ දුප්පත්කම අනුව මුල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 කවරේද;

(iv) ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක අනුව දුප්පත්කම පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) පසුගිය වර්ෂ 10 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ දුප්පත්කම පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

661/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටි,

(i) වන රක්ෂිතයන්හි ඝනත්වය;

(ii) රක්ෂිතයන්හි පිහිටි වැව් සංඛ්‍යාව;

(iii) වැසි වනාන්තර හා ඒවායෙහි ඝනත්වය;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔබ අමාත්‍යාංශය මගින් 2017 වර්ෂය තුළ,

(i) පරිසර සංරක්ෂණය වෙනුවෙන් දියත් කළ වැඩසටහන් කවරේද;

(ii) ඒ වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) පරිසර හිතකාමී ව්‍යාපාර ඇගයීම සඳහා සිදුකළ වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බොහෝ නගරයන් ඔස්සේ ගලන අපවිත්‍ර ජලය ගංගාවලට එක්වීමෙන් විශාල වශයෙන් ජල දූෂණය සිදු වන බැවින්, මෙලෙස අපවිත්‍ර ජලය සෘජුවම ගංගාවලට මුසුවීම වැළැක්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

766/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට පුරා ක්‍රියාත්මකව පවතින රට බීම අලෙවි සැල් හෙවත් වයින් ස්ටෝර්ස් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංක හා මුලින්ම බලපත්‍රය ලබාදී ඇති දිනය හෝ වර්ෂය සහ එකී ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සැර ප්‍රතිශතය අනුව සහ එක් එක් වෙළඳ නාමය අනුව 2000 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික රට බීම පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

800/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පුනරාවර්තන වියදම් වශයෙන් වෙන් කළ ප්‍රතිපාදන මුදල කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයෙන් දිවයිනේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් දිස්ත්‍රික්කය සඳහා, එම වෙන් කළ ප්‍රතිපාදනය ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

866/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කරදන, විහාරහේන ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ජල බෝතල් කිරීමේ ව්‍යාපාරය හේතුවෙන් ප්‍රදේශයේ පානීය ජල මට්ටම පහත වැටී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපාරය මුලින් 2003.12.16 දින රබර් ප්‍රඩක්ට්ස් නමින් ආරම්භ කර පවත්වාගෙන ගිය අතර පසුව, 2017.06.30 දින විහාරා නැචුරල් ප්‍රඩක්ට්ස් නමින් නල ළිඳක් මඟින් ජලය බෝතල් කර අලෙවි කරන බව දන්නේද;

(iii) ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධය සැලකිල්ලට ගෙන මේ සම්බන්ධයෙන් මා විසින් ලිපි ගණනාවක් එවා ඇති නමුත් මේ සඳහා නිසි විසඳුමක් ලබා නොදෙන්නේ මන්ද;

(iv) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර අදාළ ප්‍රදේශයේ ජල මට්ටම පහළ වැටීම වැළැක්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

932/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, මාර්ග අංක 595 යටතේ පන්ගොල්ලාමඩ සිට අකුරණ, මහනුවර හරහා මහරගමට සහ කොළඹට ළඟාවන පරිදි ශ්‍රී ලංගම බස් රථයක් දිනපතා උදෑසන 4.15 ට ධාවනය වූ බව දන්නේද;

(ii) මහරගම පිළිකා රෝහලට පැමිණෙන රෝගීන් ඇතුළු මහජනතාවගේ පහසුව පිණිස ක්‍රියාත්මක වූ එම බස් සේවාව නතර කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(iii) එම බස් සේවාව අවසන් වරට ධාවනය වූ දිනය කවරේද;

(iv) එම බස් සේවාව සතියේ සෑම දිනකම ධාවනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

969/'19

ගරු බිමල් රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොටගල, සිරිපැරකුම් විදුහල ආසන්නයේ පිහිටා තිබූ කුකුල් ගොවිපොළ, පාසල් සංවර්ධන සමිතියේ හා ගුරු මණ්ඩලයේ විරෝධය හේතුවෙන් 2015 වර්ෂයේදී ඉවත් කරනු ලැබූ බවත්;

(ii) එම කුකුල් ගොවිපළ වෙනුවට, මේ වනවිට විශාල ප්‍රමාණයේ ගවගාලක් විවෘත කිරීමට කටයුතු කරනගෙන යන බවත්;

(iii) ගවගාලක් ස්ථාපිත කිරීමෙන් ආසන්නයේ පිහිටි සිරිපැරකුම් විදුහලේ ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්ත්වයට වන අහිතකර බලපෑම හේතුවෙන් පාසල් සංවර්ධන සමිතිය හා ගුරුමණ්ඩලය විරෝධය දක්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගවගාලක් ඉදිකිරීම හේතුවෙන් ශිෂ්‍යයන්ට විය හැකි හානිය සැලකිල්ලට ගෙන මෙම ගවගාල ඉදිකිරීම නැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

977/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අත්‍යවශ්‍ය නොවන නිලධාරීන්ගේ අතිරික්තයක් සහ අත්‍යවශ්‍ය නිලධාරීන්ගේ ඌනතාවයක් පවතින බව දන්නේද;

(ii) එම නිලධාරීන් සංඛ්‍යාව තුලනය කර මහජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1003/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 මාර්තු 18 දින කොළඹ, ෂැංග්‍රිලා හෝටලේ පැවති "සුපිලිපන් මන්ත්‍රණය" නැමැති රාජ්‍ය සේවයේ අල්ලස් තුරන් කිරීම සඳහා පස් අවුරුදු සැලැස්ම එළි දැක්වීමට පැවති උත්සවය සංවිධානය කරන ලද ආයතනය කවරේද;

(ii) එම උත්සවය සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම උත්සවයට සහභාගී වූ ආරාධිතයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා මුදල් වියදම් කළ ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1023/'19

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ 5 තුළ,

(i) සුරාබදු පනතේ 58 "අ" වගන්තිය යටතේ සුරාබදු නිලධාරින්ට ත්‍යාග ප්‍රදානය සඳහා වූ අරමුදලෙන් 818 නිවේදනය උල්ලංඝනය කරමින් මූල්‍ය අක්‍රමිකතාවයන් සිදු කිරීමට අනුමතිය දී ඇත්තේ කවුරුන්ද;

(ii) එම නිවේදනයට අනුව ආදායම් එකතු කරන නිල ඇඳුම් අඳින කාර්ය මණ්ඩලයේ 1200කට සහ ආදායම් එකතු නොකරන නිල ඇඳුම් නොඅඳින නිලධාරින් 150කට වාර්ෂිකව ගෙවූ මුදල සහ එය අරමුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම නිවේදනයේ (vi) යටතේ දක්වා ඇති විශේෂ කොන්දේසිවල සීමාවට ළඟා නොවූ නිල ඇඳුම් අඳින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 5.2 වගන්තිය කඩකරමින්, පසුගිය වර්ෂ 5 තුළ නීත්‍යානුකූළ නොවන ගෙවීම් සිදු කිරීමට අනුමතිය දී ඇත්තේ කවුරුන්ද;

(ii) 7.2-iiහි හිමිකම් කිවහැකි කාර්ය මණ්ඩලයට පසුගිය වර්ෂ 5 තුළ කොපමණ ප්‍රමාණයක් ඉක්මවා ගෙවීම් සිදුකර තිබේද; එය සමස්ත තෑගි අරමුදල් ආදායමෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) 7.2 - iiහි ශ්‍රේණිවලට, හිමි කොටසට අදාළ මුදල ගෙවා ඉතිරිය 5.2 යටතේ නීත්‍යානුකුල නොවන බැර කිරීම් සිදුකර තිබේද;

(iv) ඉහත නීති විරෝධී අසමතුලිත මුදල් ගෙවීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1029/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 240 මඟින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා වෙන්කළ රුපියල් මිලියන 500 උපයෝජනය කළ ආකාරය කවරේද;

(ii) උක්ත අයවැය යෝජනාව අනුව මාස තුනකට තරුණයන් 7500 බැගින්, වර්ෂය තුළදී තරුණයන් 30,000කට පුහුණු ලබාදීමේ ඉලක්කය සපුරා ගනු ලැබුවේද;

(iii) තිස් දහසක් වැනි විශාල තරුණ පිරිසකට පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහනට උරදුන් ආයතන හා සංවිධාන කවරේද යන්නත්, එම එක් එක් ආයතනයකට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1034/'19

ගරු කනක හේරත් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සීපෝත් වසම තුළ පිහිටි සෙන්ට් කැතරින් වත්ත කැළණි ගඟේ ජල පෝෂක ප්‍රදේශයක් හා ගෝණුන්, මුවන් වැනි සතුන්ගේ නිජ භූමියක් වන බවත්;

(ii) දේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ ප්‍රදේශයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වතුයායෙහි අක්කර 50ක කොටසක් වෙන් කර එක් පුද්ගලයෙකුට හෝ පිරිසකට ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මැනීම් කටයුතු සිදු කරන්නේද;

(iii) එම මැනීම් කටයුතු රජයේ නිවාඩු දිනවලදී හොර රහසේ සිදු කිරීමට හේතුව කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් පෞද්ගලික අංශ විසින් සිදු කරන ලද ඉල්ලීම් පාරිසරික වැදගත්කම හා එල්ල වූ ජනතා විරෝධය හේතුවෙන් ප්‍රතික්ෂේප වුවද, මෙම තත්ත්වය යටතේ එම ගැටලු නැවත උද්ගත නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 සැප්තැම්බර් 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

58/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්දලන්ද හා ගොඩගම නමින් ගම්මාන තිබෙන බවත්;

(ii) එම ගම්මාන තවමත් ඉතා දුෂ්කර තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගම්මානවලට අවශ්‍ය පොදු පහසුකම් සපයා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

105/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 ජුනි 11හෝ ඊට ආසන්න දිනවල කුරුණෑගල දිස්ත්‍රික්කයට බලපාන ලද තද සුළං තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ නිවාස සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අවතැන් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iv) විනාශ වූ දේපළවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ දේපළ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) එම ප්‍රතිපාදන නියමිත පරිදි ලබා දී තිබේද;

(iii) හානි වූ ජීවිත වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල කොපමණද;

(v) කිසිදු වන්දියක් ලබා දී නොමැති නිවාස තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

163/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරන සේවකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පිරිවෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

277/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සහල් ආනයනයේදී සහල් කිලෝවක් සඳහා අයකරන ලද බදු මුදල කොපමණද;

(iii) ඒ අනුව, 2015, 2016 සහ 2017 වර්ෂවලදී සහල් ආනයනය සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඉහත වර්ෂවලදී සහල් ආනයනය සඳහා අය කරන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම වර්ෂවල සහල් මිලෙහි උච්චාවචනය පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

768/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නිකුත් කර ඇති කැසිනෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංක හා මුලින්ම බලපත්‍රය ලබාදී ඇති දිනය හෝ වර්ෂය සහ කැසිනෝ ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) මේ වනවිට ඉල්ලුම් කර ඇති නව බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

801/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ,

(i) පුනරාවර්තන වියදම;

(ii) එහි සේවක වැටුප් හා දීමනා සඳහා වැය කර ඇති මුදල;

(iii) කුළී සහ බදු පදනමින් ලබා ගත් වාහන සඳහා වැය කර ඇති මුදල;

(iv) ඉන්ධන සඳහා වැය කර ඇති මුදල;

(v) විදුලි හා ජල ගාස්තු සඳහා වැය කර ඇති මුදල;

(vi) දුරකථන ගාස්තු සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) අධිකාරියේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් දීමනා සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

867/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වතු නිවැසි ජනතාවට එම වතුවලින් පර්චස් 07 බැගින් භුක්තිය සඳහා ලබාදීම සිදු කර තිබේද;

(ii) ඒ අනුව ඇහැළියගොඩ, අයගම, කිරිඇල්ල හා කුරුවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සිටින වතු නිවැසියන්ටද එලෙසින්ම ඉඩම් පර්චස් 07 බැගින් භුක්තිය සඳහා ලබාදීමට ක්‍රියා කරන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

876/’19

ගරු තේනුක විදානගමගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය මැතිවරණ කොට්ඨාසයේ ආරම්භ කරන ලද පානීය ජල යෝජනා ක්‍රමය පිළිබඳ වත්මන් තත්ත්වය කවරේද;

(ii) එම ඒකාබද්ධ ජල ව්‍යාපෘතියේ පළමු අදියර මඟින් පානීය ජල පහසුකම් ලබා දිය යුතුව තිබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) පානීය ජලය ලබා දීමට නොහැකි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ජල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) මෙම ජල ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කිරීමේ සූදානමක් තිබේද;

(vi) එසේ නම්, ඒ පිළිබඳ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වකුගඩු රෝගීන් විශාල සංඛ්‍යාවක් වෙසෙන මහියංගණය මැතිවරණ කොට්ඨාසයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

877/’19

ගරු විමලවීර දිසානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018/2019 මහ කන්නයේදී ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගා කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එයින් සේනා දළඹු වසංගතයට ගොදුරුව විනාශ වූ බඩ ඉරිඟු වගා ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම වගා විනාශයෙන් ගොවීන්ට සිදුවූ දළ අලාභය කොපමණද;

(iv) සේනා දළඹු වසංගතයට ගොදුරුව බඩ ඉරිඟු වගාවන් විනාශ වීමෙන් අසරණ තත්ත්වයට පත්වූ ගොවීන්ට සහන ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

933/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒ. එච්. එම්. ෆයිරුක් මහතා, කොළඹ, දාරුස්සලාම් මහා විද්‍යාලයේ සේවයේ නියුතුව සිට අංක බප/කො/කලාප/ගුරුපා/7 හා 2006.06.30 දිනැති ලිපිය මඟින් 1989.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගැන්වූ උපගුරුවරයෙකු බව දන්නේද;

(ii) එකී දිනයේ සිට විශ්‍රාම ගැන්වූ ෆයිරුක් මහතාට 1997.01.15 දින සිට විශ්‍රාම වැටුප ගෙවීම අනුමත කළද මෙතෙක් විශ්‍රාම වැටුප් ලබාදීම ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iii) වසර 25ක කාලයක් ගුරු සේවයේ නියුතුව සිට දැනට වයෝවෘද්ධ තත්ත්වයේ පසුවන ෆයිරුක් මහතාට හිමි විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් අදාළ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමටත් සහ විශ්‍රාම වැටුප් නොපමාව ලබාදීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

937/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉංගිරිය, ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ මුදල් වර්ෂ ගණනාවක සිට සාවද්‍ය ලෙස පරිහරණය කරන බවට සහ තවත් විෂමාචාර පිළිබඳව පළාත් අධ්‍යාපන අභ්‍යන්තර විගණන අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව විගණන පරීක්ෂණයක් සිදු කළ බවත්;

(ii) විගණන විමසුම අනුව, සාවද්‍ය කටයුතුවලට වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගන්නා මෙන්, හොරණ කලාප අධ්‍යක්ෂකවරයාගේ සිට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා දක්වා සියලුම බලධාරීන්ට දැනුම් දී ඇතත්, මේ වනතෙක් විසඳුමක් ලබාදී නොමැති බවත්;

(iii) චූදිතයන් විදුහලෙන් ඉවත් නොකරන්නේ නම්, ස්ථාන මාරුවක් ලබාදෙන ලෙසට විදුහල්පතිවරයාගේ ඉල්ලීම අනුව ඔහුට ස්ථාන මාරුව ලබාදී ඇති බවත්;

(iv) විදුහල නඟා සිටුවීමට මහත් පරිශ්‍රමයක් දැරූ විදුහල්පතිවරයා මාරුකර විදුහල පරිහානියට පත්කළ චූදිතයන් විදුහලේම රඳවා අදාළ මූල්‍ය චෝදනා සුළුකොට සළකා කටයුතු කිරීමෙන් චූදිතයන් බලවත්වීමෙන් දෙමව්පියන් හා ශිෂ්‍යයන් අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ අනුව විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මුදල් සාවද්‍ය පරිහරණයට යොදවන පුද්ගලයන් ආරක්ෂා කිරීම වැරදි පූර්වාදර්ශයක් නොවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

978/’19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාතට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල නගරයේ පිහිටා ඇති පොලිස් ස්ථානය පවත්වා ගෙන යන්නේ දැනට වසර 40කට පමණ පෙර පොලිස් දෙපාර්තමේන්තුව විසින් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක බවත්;

(ii) එම ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ගලේවෙල, නබඩගහවත්ත, මස්ජිදුල් පලාහ් නමැති මුස්ලිම් පල්ලිය සතු ඉඩමක බවත්;

(iii) මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම එම මුස්ලිම් පල්ලිය සතු එකම දේපළ බවත්;

(iv) එම දේපළ පල්ලිය වෙත ආපසු ලබා ගැනීමට පල්ලියේ පූජකතුමන්ලා විසින් වරින්වර පොලිස් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් එම ඉල්ලීම් ඉටු වී නොමැති බවත්;

(v) මෙයට විකල්පයක් ලෙස පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා ගලේවෙල නගරයේ, පත්කොලගොල්ල පාරේ, අක්කර එකහමාරක ඉඩමක් වෙන්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ ඉඩමක් වෙන් කර තිබියදීත්, පොලිස් ස්ථානය එම ඉඩමේ ඉදිකිරීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර මෙම පොලිස් ස්ථානය පිහිටි භූමිය සහ ගොඩනැගිල්ල මුස්ලිම් පල්ලියට ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1005/’19

ගරු බිමල් රත්නායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1605, තඹකන්ද ග්‍රාම නිලධාරි වසමේ, හිබුඩාව ග්‍රාමයේ, අංක 03 කෝවිල්කන්ද නමැති පෞද්ගලික භූමිය තුළ පුරාවිද්‍යා වටිනාකමක් සහිත නටඹුන් විශාල ප්‍රමාණයක් විසිරී පවතින බව දන්නේද;

(ii) 2014.06.11 දින මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල්වරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා එවකට පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිළිතුරක් යවා ඇති බවත්;

(iii) 2014.05.27 දින පුරාවිද්‍යා බලධරයන් පිරිසක් පැමිණ සිදු කළ ස්ථානීය පරීක්ෂාවට අනුව අක්කර පහක් පමණ විශාල වූ භූමි ප්‍රදේශයක පුරාවිද්‍යා නටඹුන් වශයෙන් ස්තූප ගොඩනැගිල්ලක්, නටඹුන් ගොඩනැගිලි දෙකක්, කණු පාදම් ගල්, පැරණි ගඩොල් උළු හා මැටි බඳුන් කැබලි විසිරී ඇති බව තහවුරු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම භූමිය මායිම් කණු යොදා ආරක්ෂාව සඳහා වෙන් කිරීමටත්, එම ස්ථානය ආරක්ෂිත ස්මාරකයක් ලෙස ගැසට් කිරීම සඳහා ලියාපදිංචි කිරීමටත්, 2014 වර්ෂය තුළදීම කටයුතු කරන බවට දන්වා වර්ෂ පහකට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ වනවිටත් එම කටයුතු ක්‍රියාවට නංවා නොතිබීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1012/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාව වෙත ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා වර්තමානය වනවිට අවශ්‍ය වන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2019.01.01 දිනය වනවිට රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) අවශ්‍ය ඉලක්කය සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරි වර්ෂවලදී රාජ්‍ය සේවයට බඳවා ගැනීමට යෝජිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව බිහි කර ගැනීම සඳහා රජය සැලසුම් කර ඇත්තේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1030/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 243ට අනුව, සංචාරක කර්මාන්තයට අදාළ පුහුණු පාඨමාලාවලට වෙන් කරන ලද රුපියල් මිලියන 100 උපයෝජනය කළ ආකාරය කවරේද;

(ii) උක්ත යෝජනාවේ සඳහන් පරිදි කාර්තුවකට තරුණයන් 3000 බැගින් වර්ෂය තුළදී තරුණයන් 12,000කට පුහුණුව ලබා දුන්නේද;

(iii) මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ ආයතන හෝ සංවිධාන කවරේද; එම ආයතන හෝ සංවිධානවලට වර්ෂය තුළදී කරනු ලැබූ මුළු ගෙවීම් ප්‍රමාණය සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පා. 5/'18

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ගරු වජිර අබේවර්ධන මහතා,— රජයේ මාධ්‍ය ආයතනවල සභාපතිවරයන් සහ අධ්‍යක්ෂක මණ්ඩල ඇතුළත්ව නීත්‍යානුකූල නොවන පත්වීම් ලද සියල්ලන් විසින් නීති විරෝධී ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව නඩු පැවරිය යුතු බව,— 2018 ඔක්තෝබර් 26 වැනි දින ගරු රනිල් වික්‍රමසිංහ මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව අග්‍රාමාත්‍ය තනතුරෙන් ඉවත් කර ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍ය, අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය යන තනතුරු නීත්‍යානුකූලව දරන පුද්ගලයන් නොමැති බව කථානායකවරයා විසින් ප්‍රකාශ කර ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍යවරයා නීති විරෝධී ආකාරයෙන් ඉවත් කිරීමෙන් පසු සිදු කරන ලද සියලු කටයුතු සහ ලබා දෙන ලද පත්වීම් ආරම්භයේ සිටම නීති විරෝධී සහ අවලංගු වන හෙයින්ද, එවැනි නීති විරෝධී පත්කිරීම් තුළට සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන රජයේ මාධ්‍ය ආයතනවල සභාපතිවරයන් සහ අධ්‍යක්ෂක මණ්ඩල ඇතුළත් වන හෙයින්ද; සහ

මෙකී සියලු පත්කිරීම් සඳහා නීතිමය පදනමක් නොමැති බවත්, කිසිදු පුද්ගලයකු හට එකී තනතුරු දැරීමට සහ/හෝ එකී තනතුරුවල කටයුතු සිදු කරගෙන යෑමට අයිතියක් නොමැති හෙයින්ද;

ඊට අනුකූලව, එකී තනතුරු දැරීමට අදහස් කරන සහ/හෝ එකී තනතුරුවල කටයුතු කරන පුද්ගලයන් නීති විරෝධී ආකාරයෙන් කටයුතු කරන බැවින්, ඔවුනට විරුද්ධව නඩු පැවරිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2.

පා. 6/'18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් සිරිසේන අමරසේකර මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින් අග්‍රාමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් සිරිසේන අමරසේකර මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අග්‍රාමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම ආයතනය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී සිරිසේන අමරසේකර මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

3.

පා. 7/'18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාගේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී එස්. ආර්. ආටිගල මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

4.

පා. 8/'18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයාගේ ලේකම් උපාලි මාරසිංහ මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් උපාලි මාරසිංහ මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී උපාලි මාරසිංහ මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

5.

පා. 9/'18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින ජාත්‍යන්තර වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ ලේකම් එස්. ටී. කොඩිකාර මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, ජාත්‍යන්තර වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් එස්. ටී. කොඩිකාර මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී එස්. ටී. කොඩිකාර මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

6.

පා. 10/'18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයාගේ ලේකම් බර්නාඩ් වසන්ත පෙරේරා මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් බර්නාඩ් වසන්ත පෙරේරා මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී බර්නාඩ් වසන්ත පෙරේරා මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

7.

පා. 61/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු කනක හේරත් මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු එස්. බී. දිසානායක මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු ජයන්ත සමරවීර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය ලෙස හඳුන්වන 2019 අප්‍රේල් 21 දින කිතුනු පල්ලි සහ හෝටල් ඇතුළු ස්ථාන නවයකට එල්ල වුණු ත්‍රස්තවාදී ප්‍රහාර සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් නිදහස් කරන මෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ හමුදාපතිවරයාට බලපෑම් කරනු ලැබූ බවට හමුදාපතිවරයා විසින් 2019 මැයි 5 දින සිළුමිණ පුවත්පතට ප්‍රකාශ කරනු ලැබ තිබූ හෙයින් ද;

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ල කරනු ලැබූ ඉම්ෂාන් අහ්මඩ් ඊබ්‍රාහිම්ට හිමි කර්මාන්ත ශාලාවට සම්මතයට පටහැනිව කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් හිස් පතොරම් කොපු සපයා ඇති හෙයින් ද;

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රණවිරුවන් අධිකරණයට ඉදිරිපත් කර වසරකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතකිරීමට කටයුතු කළ ශ්‍රී ලංකා පොලීසිය, බෝම්බ නිෂ්පාදනය කිරීමට කටයුතු කළ බවට සැක කරන එකී කම්හලේ සේවකයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිකරණයට ඉදිරිපත් නොකර 2019.05.06 දින ඔවුන්ට ඇප ගැනීමට ඉඩ සැලැස්වීමෙන් දේශපාලන බලපෑමක් ඇති බවට සාධාරණ සැකයක් මතු වන හෙයින් ද;

රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයා නායකත්වය දරන සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ, භාණ්ඩාගාරික වන එස්. කේ. පී. අලහුඩීන් ත්‍රස්තවාදීන්ගේ ප්‍රයත්නයන් පිළිබඳ යථා තොරතුරු දැන සිට එය බලධාරීන්ට හෙළි නොකර සිටීමෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය කටයුතු කළ හැකිව තිබියදී එසේ නොකළ හෙයින් ද;

අමාත්‍යවරයාගේ ප්‍රබල හිතවතෙකු වන අල්හාජ් මොහොමඩ් ඊබ්‍රාහිම් යුසුෆ් ඊබ්‍රාහිම්ගේ පුතුන් දෙදෙනෙකු මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන් ලෙස කටයුතු කළ හෙයින් ද;

සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ද වන අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙස පෙනී සිටි අබ්දුල් හනුත් ත්‍රස්තවාදී සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගෙන ඇති හෙයින් ද;

අමාත්‍යවරයාගේ උපදේශකවරයෙකු ලෙස පෙනී සිටින මවුලවිවරයෙකු ත්‍රස්තවාදී සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගෙන ඇති හෙයින් ද;

අමාත්‍යවරයාගේ සහෝදරයෙකු වන රිෆ්කාන් බදියුදීන් යුද හමුදාව විසින් අත්අඩංගුවට ගෙන මන්නාරම පොලීසියට භාර දීමෙන් පසු උසාවියට ඉදිරිපත් නොකර බලපෑම් මත නිදහස් කළ හෙයින් ද;

පාස්කු ඉරු දින ත්‍රස්තවාදී ප්‍රහාරය සම්බන්ධ විමර්ශනයන්ට අමාත්‍යවරයා විසින් අනිසි බලපෑම් කරන බවට ආරක්ෂක හමුදා සහ පොලීසියේ නිලධාරීන් පවසන තොරතුරු මත සමාජයේ ප්‍රබල මතයක් මතු වී ඇති හෙයින්; සහ

ත්‍රස්තවාදීන් සහ අමාත්‍යවරයා අතර ප්‍රබල සම්බන්ධයක් ඇති බවට මතු වන සැකය පැහැදිලිව තහවුරු වී තිබිය දී, අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳ ප්‍රශ්න කිරීමට පොලීසිය මෙතෙක් අසමත් වීමෙන් එතුමා විසින් අමාත්‍යධුරය දැරීම විර්මශන කටයුතු සඳහා බාධාවක් බවට පෙනී යන හෙයින් ද;

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය රිසාඩ් බදියුදීන් මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.